අගද තන්ත්‍රය
හෙවත්
විෂ වෙද පොත

සීවලී බණ්ඩා අප්පුහාමි

අගද තන්ත්‍රය

හෙවත්

විෂ වෙද පොත

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

අගද තන්ත්‍රය

TORICOLOGY POISONS AND TREATMENT

ආයුර්වේදයෙහි සඳහන් අංග අට අතුරින් පස්වැනි අංගය අගද තන්ත්‍රය නම් වේ. මේ අගද තන්ත්‍රය වනාහි ජංගම සංඛ්‍යාත විෂ සහිත සතුන්ගෙන් ශරීර ගතවන විෂ හා ස්ථාවර සංඛ්‍යාත අල, මුල්, පත්‍ර, පාෂාණ සහ කෘත්‍රිම විෂ ආදී නන් වැදෑරුම් විෂ හා ප්‍රති විරුද්ධ විෂ ද ඒවායේ ක්‍රියාවන්ද, ඒවා සමන වීමට වුවමනා උපදෙස් හා චිකිත්සා ද උගන්වන ශාස්ත්‍රය යි.

සර්ප වෘශ්චික ලූතානාං විෂෝප ශමනී තුයං
යාක්‍රියාං විෂ තන්ත්‍රඤ්ච නාම ප්‍රොක්තං මණීෂිභිඃ

සර්ප, වෘශ්චික, දිවිමකුළු ආදී විස සතුන්ගෙන් ශරීර ගත වූ විෂ හා ස්ථාවර විෂයන්ගෙන්ද විෂෝප විෂ සමන ක්‍රියා විෂ චිකිත්සාව හෙවත් අගද තන්ත්‍රය නම් වේ.

1. විෂ ස්ථාවර ජංගම යයි ද්වි ප්‍රකාර වේ.

අ රසදිය, තඹ ආදි ධාතූන්ගේ ද, පාසානම්, මනෝසීල ආදි උප ධාතූන්ගේ ද, අබින්, ජයපාල කංසා, අත්තන, වච්චනාවි, ගොඩකදුරු, නියඟලා; ඔලිඳ ඇට ආදී මූල ද්‍රව්‍යයන්ගේ ද ඇත්තා වූ විෂ ස්ථාවර විෂයි.

ආ සර්ප, බලු, මී, ගෝනුසු, පත්තෑ, දිවිමකුළු, බමර, දෙබර ආදි ප්‍රාණීන් ගේ විෂ ජංගම විෂ නම් වේ.

2. නිද්‍රා, තන්ද්‍රා, කලාන්ති, දහ, අපාක, රෝමාඤ්ච ශොථ, අතීසාර යන ලක්‍ෂණයෝ ජංගම විෂයෙන් ඇති වෙත්.

3. ස්ථාවර විෂයෙන් ඉහතින් දක්වූ ලක්‍ෂණ ඇතිව විශෙෂයෙන් ජ්වර, හික්කා, දන්තහර්ෂ, ගලවේදනා, ඵෙණ වමන, අරුචි, ශ්වාස, මූර්ඡා යන ලක්‍ෂණයෝ ඇතිවෙත්.

ස්ථාවර විෂ

INANIMATE POISON

යම් ද්‍රව්‍යයක් ශරීර ගත වූ කල රක්තයා (ලේ) සමග මිශ්‍ර වීමෙන් ස්වාස්ථ්‍යය හාණි කරයි ද, ඇතැම් විට මරණයක් ගෙන දෙයි ද ඒ විෂ නම් වේ,.

1. හදිසි කරුණක් හේතුකොට ගෙන,
2. සිය පණ හානි කර ගන්නට තැත් කිරීම,
3. මිනී මැරීමට තැත් කිරීම,
4. වරදවා භාවිත කිරීම,

ආදි කරුණෙකින් ස්ථාවර විෂ ශරීර ගතවන්නට පුළුවන් වෙයි.

සනීපයෙන් සිටි කෙනකුට යමක් කැවීමෙන්, ඒ එක්කම තදින් අසනීපයක් සෑදුණොත් ඔහුට වහ කැවුණු බව අනුමාන කළ හැක. එසේම බෝතලයක් ළඟ තබා ගෙන කට හා තොල් පිලිස්සී සිහි නැතිව කෙනකු වැටී සිටින කල හෝ මූර්ඡාවී දඟලන විට ඔහුට වස කැවෙන්නට ඇතැයි කල්පනා කළ හැක.

ළමයිනට වස කැවෙන්නේ ප්‍රමාදයෙන් බව සැලැකිය යුතුය. සමහර ගස්වල ගෙඩි, ගෙදර තබා තිබෙන වස, නොදැනුවත් කමින් ළමයිනටද කැවෙන්නට පුළුවන. වස කැවුණු කල සැක කිරීමට ආමාශයේ වේදනා, වමනය, කෙණ්ඩා පෙරළීම, සිනාසීම වුවමනාවට වඩා කථාව යනාදී ලකුණු ඇති වේ.

සමහර විට එකවරටම ''කවර වස වර්ගයක් කැවී තිබේද''යි සෝදිසි කිරීම උගහට වේ.

එසේ වුවත් සියලු ස්ථාවර විෂ වර්ග කොටස් දෙකකට බෙදිය හැකි වේ.

1. කටේ ලකුණු සිටින හෙවත් පිළිස්සීමේ ලකුණු ඇතිවන විෂය,
2. කටේ ලකුණු නො සිටින විෂ්ය යි, යනුවෙනි.

1. වර්තමාන කාලයෙහි භාවිත කරන 'ඇසිඩ්' යන නමින් හඳුන්වන ද්‍රාවකද, ඇල්කොලයිඩ් වර්ග හෙවත් ක්‍ෂාර වර්ගද කට, ගලනාල, ආමාශය ආදිය දවන වර්ගයි. දිගටම ලකුණු ඇති වෙයි. හෙවත් පෝෂණ මාර්ගය දවයි.

2. අබින්, රසදිය ආදියෙහි දී මුඛයෙහි ලකුණු නොසිටී.

ඒ නිසා, ඇසිඩ් වර්ග (ගිනි වතුර) ක්‍ෂාර වර්ග (ඇල් කොලයිඩ් – කෝස්ටික් සෝඩාදී වර්ග) මුඛයෙහි පටන් ආමාශය දක්වා ඇති සෙම් සිවිය දවයි. ඒ වර්ග ශරීර ගත වූ විට වමනය නො කරවන්නේය. එහෙත්, ඒ සැර ඛාල කර සුදුසුයයි හැඟුණොත් වමනය කරවන්නේය.

අනෙක් විෂ වර්ග ශරීර ගත වූ කල ඉක්මනින්ම වමනය කරවිය යුතුය.

විෂ වර්ගවලට ප්‍රතිකාර කිරීමේ දී විෂ ශරීරයෙන් පහ කිරීම ද, පසුව විෂ නිර්විෂ භාවයට පැමිණවීමට ඖෂධ දීමද එසේම හෘදය උත්තේජක කිරීමට ඖෂධ දීමද, අක්මාව හොඳින් ක්‍රියා කිරීමට බෙත් දීමද කට යුතුය.

විෂ පහ කිරීමට මුලදී වමනය කරවීම යෝග්‍ය වේ. අන්තිමේ විෂ නිර්විෂ භාවයට පමුණුවා විරේක කරවිය යුතුය. එහෙත් කටේ ලකුණු සිටින විෂ ශරීර ගත වූවන්ට විෂ නිර්විෂ භාවයට පැමිණ වීමට ද ප්‍රතිකාර යොදනු ලැබේ.

i. කටේ ලකුණු සිටින විෂ වර්ගය ද්‍රාවකයක් (ඇසිඩ් එකක්) ද, ක්ෂාර (ඇල්කොලයිඩ්) යක් ද යනු නිශ්චය නොවී නම් පොදුවේ නිර්විෂ වීමට මෙහි පහත දක්වන දේ පුළුවන් තරම් පොවන්නේය.

1. ඇල්දිය 2. කුරුම්බා වතුර 3. නවසි වතුර 4. පොල් කිරි, විශේෂයෙන් නවසි පොල් කිරි 5. එළකිරි 6. තැඹිලි වතුර 7. නරමුත්‍ර 8. මහා විෂනිල තෛලය හෝ එවැනි තෙලක්, මේස හැන්දක් යොද තැඹිලි වතුර, නවසි වතුර, නරමුත්‍ර ආදියක් සමග,

(අ) ඇසිඩ් වර්ග, ගිනි වතුර එක්කෝ ද්‍රාවක ශරීර ගත වූ කල පුළුවන් තරම් සෝඩා වතුර, පොවන්නේය. සෝඩාබයිකාබ් (ආප්ප පිපීමට යොදන වර්ගය) වතුරට ටික ටික මිශ්‍ර කර දියකර පොවන්නේය. අලු කෙහෙල් අල හෝ බොඩ හෝ පතුරු හෝ යමකින් ලබාගත් යුස – අලු පුහුල් යුස – හැකි තරම් පොවන්නේය.

(ආ) ක්ෂාර වර්ග (කෝස්ටික් සෝඩා වැනි ක්ෂාර වර්ග) ශරීර ගත වූ කල දෙහි ඇඹුල් හෝ නියම විනාකිරි වතුරට දමා පුළුවන් තරම් පොවන්නේය. තවසි වතුර, පොල් කිරි කහ සමග, තලතෙල් සහ හුණු වතුර මිශ්‍රකර හෝ පොවන්නේය.

ii. කටේ ලකුණු නො සිටින වර්ග ශරීර ගත වූ කල වමනය කරවන්නේය.

1. උණු වතුර තඹලේරුවකට (අවුන්ස අටකට) අබ කුඩු මේස හැන්දක් දිය කර පොවන්නේය.

2. මඳක් උණුසුම් වතුර අවුන්ස අටකට සාමාන්‍ය ලුණු මේස හැඳි 2 ක් මිශ්‍ර කර දෙන්නේය.

3. හාල්මැස්සන් සෝදා, ඒ වතුර රෙද්දකින් පෙරා අවුන්ස 12 ක් බොන්න දෙන්නේය.

4. උණුසුම් වතුර පතකට කුකුරුමාන් පිළියෙළ කළ චූර්ණය මේස හැන්දක් බහා බොන්න දෙන්නේය.

5. උණුසුම් වතුර අවුන්ස 8 කට ශුද්ධ කළ පල්මාණික්කන් රති හතරක බර දිය කර දෙන්නේය.

6. තිත්ත වැටකොළු සහමුලින් ගෙන කොටා මිරිකා පතක්, මී, ගිතෙල් සමග දෙන්නේය.

7. තිත්ත ලබු මුල් හා කොළ යුෂ, පතක් පොවන්නේය. මීටද ගිතෙල් තල තෙල් දමා දෙන්නේය.

මේ සියල්ලම වමනය උපදවයි. වමන වූ කල නිර්විෂ භාවයට පැමිණෙන ඔසු දිය යුතුය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

(අ) විෂ නිර්විෂ භාවයට පමුණුවන වගී;-

i තන කිරි ii. එළකිරි iii. කුර, කුර තම්පලා ස්වරස, iv. කොස් පට්ටා ඇල් දියෙන් අඹරා දිය කර ගත් යුස v. පුසුල් එල යුස, එම දඹු යුස vi. අලු කෙහෙල් අල යුස vii. කිකිරිදිය යුස viii. ගිතෙල් ix. සුදු හඳුන් වැල් මී, ඉඟිනි ඇට, තෙඹු අල, මේවා තැඹිලි වතුරෙන් අඹරා ඊට දිය කරගත් දියර x. නවසි වතුර xi. නවසි කහකඩ ස්වරස xii. පේර ස්වරස xiii. විෂනිල තෛලය සහ ඊට සමාන තෙල් වර්ග xiv. නරමුත්‍ර xv. ගෝමුත්‍ර xvi. නවසි පොල් කිරි xvii. පේර කොළ පොල් දමා කොටා, පිසූ කැඳ කිතුල් පැණි හෝ හකුරු සමග, යන මේවායි.

(ආ) හෘදය දුර්වලවන අවස්ථා වලදී එය උත්තේජක කරවන ප්‍රතිකාරද කට යුත්තේය.

i. තේ, කෝපි, පොල්කිරි කැඳ කිතුල් හකුරු සමග, තිරිඟු පිටි කැඳ පේර කොළ කැඳ

ii. මුං ඇට තැම්බූ වතුර

iii. අර්ජුනාරිෂ්ටය

iv. තෙඹු අල, කළුකැම්මෙරිය, පිට සුදු පලා මේවායේ ස්වරස.

v. මහා සුගන්ධ අගදය

(ඉ) විෂ නිර්විෂ භාවයට පැමිණ වීමෙන් පසු විරේක කට යුතුයි.

i. යුක්තායුක්ති සලකා එරඬු තෙල් දීමෙන් විරේක කරන්නේය.

ii. රතිකාම තෛලය විෂනිල තෛලය එකතු කර අවුන්ස 2 ක්, පෙවීමෙන් විරේක වෙයි.

iii. එළ කටරොළු මුල් කලං 1½ ක් එළකිරෙන් අඹරා දෙන්නේය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

විෂ තන්ත්‍රයන්හි විෂ නිර්විෂ භාවයට පමුණුවා පිට කිරීමට එළකටුරොළු මුල් කලං 1¼ ක් එළකිරෙන් අඹරා ඊට දියකර මෙහි පහත දක්වෙන මන්ත්‍රයෙන් මතුරා දෙන්නට නියම කර තිබේ.

"ඕං නමෝ. භගවතේ උද්ගා මේශ්වරාය කුංචි තාමුත ජටාය ඨඃ ඨඃ ස්වාහා"

පාසානම් ආදි සියලු විෂ නසා සුවයට පැමිණේ.

ජංගම විෂ අධ්‍යායෙහි සඳහන් වන තෛල, අගද ආදිය ද ස්ථාවර විෂයෙහි යුක්ත්‍යුක්ති බලා යොදන්නේය. එසේම විෂ නාසක ඝෘත ආදිය ද භාවිත කරන්නේය. අක්මාව, පිත විෂයන්ගෙන් දූෂිත වන නිසා රත්පිත් චිකිත්සාවේ ප්‍රතිකාර, සෙංගමාලයෙහි දක්වෙන යුස වර්ග ද යොදන්නේය.

යම් විෂක් හේතුකොට ගෙන, යම් යම් දෝෂ කිපෙන්නේද, එසේම යම් යම් ක්‍රියා ප්‍රකාශ වන්නේද, ඒ ඒවාට සුදුසු සේ ප්‍රතිකාර කරන්නේය. මල බද්ධ, මූත්‍ර බද්ධ, ආදිය ද ඒ ඒ චිකිත්සාවන්ගෙන්, සමනය කරන්නේය.

ශිරීෂ වෘක්ෂයේ (මාරා ගසේ පංචාංගය) මුල්. පොතු, පත්, මල්, ඇට, එළකිරෙන් හෝ තනකිරෙන් හෝ ඇල්දියෙන් හෝ නරමූත්‍රයෙන් හෝ අලු කෙසෙල් යුසින් හෝ, අඹරා ඒ ඒවාට දියකර දෙන්නේය. එසේම තැඹිලි දිය, නවසි දිය, එළකිරි ආදියෙන් කසාය කර හෝ දෙන්නේය. සියලු විෂ නිර්විෂ භාවයට පත් වෙයි.

ආශ්වාස ප්‍රාශ්වාසය නැවතීමේ ලකුණු පෙනෙන විට, බාහිර උපක්‍රමයන් ගෙන් ඒ සිද්ධ කරන්නේය. මුව අං භස්මය, හෝ කඟවේනා අං තනකිරෙන් මංචාඩිය ¼ සිට 1 දක්වා දෙන්නේය. එවිට විෂයෙන් වූ රෝගීන්ගේ ආශ්වාස ප්‍රාශ්වාස හොඳින් කෙරේ.

ඒලාඝෘතය

හාතාවාරිය අල යුස, අලු කෙසෙල් අල යුස, මාරා ගසේ පසහේ යුස, කුරතම්පලා යුස, නැලිය බැගින්, එළකිරි නැලි 4 යි, ගිතෙල් නැලි 1 යි, කල්කයට - වැල් මදට, වැල් මී, තෙබු අල, තිපල්, වඳුර මෑ ඇට, බැබිල මුල්, මේද, ක්ෂීරකාකෝලි, අමුක්කරා, අසමෝදගම්, කහ, ගැට කහ (වෙනිවැල් ගැට) පෙරුම්කායම්, කටුකරෝසන, එළකටරොළු මුල්, මානෙල් අල, කෙකටිය, අල, තෙල් ඕලු අල, මුද්දරප්පලම්, කාකෝලි, දෙසඳුන් කලං 1½ බැගින් අඹරා, සියල්ල යොද, පදමට සිඳ පෙරා ගන්නේය. වරකට කලං 1½ බැගින් යෙදීමෙන්, විෂ, රත්පිත් නසා.

විෂයනට කලින් දක්වූ ප්‍රතිකාර කර මදක් සමනය වූ විට මෙය දෙන්නේය. පරණ විෂ – දූෂී විෂ යන්ටද මෙය යොදන්නේය.

මෘත්‍යුපාශච්ඡේදි ඝෘතය

ඉඳිබොඩ යුස, කූර යුස, කටුපෙඳ (තුන්කටු) යුස, ඕලු දඬු යුස, කෙකටිය යුස, යන මේවා නැළි 4 බැගින් ගිතෙල් නැළි 4 යි, එළකිරි නැළි 16 යි, කල්කයට ගෝරෝචන, සුවඳ කොට්ටන්, වරාමුල්, නිල් මානෙල් අල සැවැන්දන මුල්, අමලවේතස, මදුරුතලා, කෙළිඳ හාල්, වැල්මදට, ඉරමුසු, කිරිවැල්, කබර සුමුල්, හාතාවාරිය, කටුපෙඳ, නිදිකුම්බ, නෙළුම් රේණු, මදරා අරටු, කලං 3 බැගින් අඹරා, පදමට සිඳ පෙරා ගන්නේය.

කලං 1½ බැගින්, දීමෙන්, සියලු විෂයෙන් වූ උවදුරු නසා.

මෙය විසට සෑහෙන තරමක් ප්‍රතිකාර කිරීමෙන් පසු යොදන්නේය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

තණ්ඩුලාදි කසාය

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

කුරමුල්, මානෙල් අල, නෙළුම්මල් රේණු, පුසුල් දඬු, කෙකටිය අල, ඉදි බඩ, සියල්ල පලම් 2 ක් ගෙන කපා කොටා දිය පත 2 ක් බහා, තබා, පසුව පෙරා, දෙන්නේය, හිම කසායයි, සියලුම විෂ නිර් විෂ භාවයට පමුණුවයි. අලුත් පරණ කොයි විෂටත් මේ දෙන්නේය.

ධාන්‍යකාදි කසාය

කොත්තමල්ලි, කුරමුල්, සැවැන්දන, ඉඟිනි ඇට, සුදු හඳුන්, බෝ අංකුර (හෝ පොතු) යකවනස්ස කොළ, සස්සඳ මුල්, ඉදිබොඩ, කොස් පනා පට්ටා, විලඳ, නෙළුම් අල, පැපිලිය, කහඹිලියා මුල්, කිරිවැල් මුල්, සම භාග නවසි වතුරෙන් හෝ තැඹිලි වතුරෙන් කසාය කර දෙන්නේය. ස්ථාවර විස හා එයින් ඇතිවුණු දැවිලි, පිපාසා, ක්ලාන්ත සුවවෙයි.

ඉදිබඩ කසාය

ඉදිබොඩ පලමයි, සුදු හඳුන් කලං 12 යි, තැඹිලි වතුරෙන් සිඳ ගිතෙල් බහා දෙන්නේය. සියලු ස්ථාවර විස සමනය වේ, දැවිලි, පිපාසා, ඇති විට මෙය යොදන්නේය.

පුසුල් දඬු කසාය

පුසුල් දඬු, නෙළුම් අල, ඉරිවේරිය, අගිල්, සුදු හඳුන්, සැවැන්දන, තුවරලා, දෙළුම් ඇට, රතුලූනු, මඟුල් කරඳ පොතු, මාරා පොතු, කුර මුල්, හීන් නිදිකුම්බ මුල් කසාය-නවසි දියෙන් සිඳ ගන්නේය. සියලු වස විස සමනය වේ.

වැල්මී ආදී කසාය

වැල්මී, ඉරමුසු මුල්, කිරිවැල් මුල්, මී මල්, ඇද්දෙමට මුලේ පොතු, තිපල්, සුදු හඳුන්, මානෙල් අල, කෙකටිය අල, කොත්තමල්ලි, නෙළුම් අල, කලාඳුරු අල, සැවැන්දන, පොඩිදෑල් සම භාග- පලම් 2 ක් ගෙන - කපා - කොටා- තලා - හාල්පාණු දියේ (පත 4 ක) බහා තබා, සිසිල් වූ පසු වරකට පත බැගින් බොන්නේය. සියලු දැවිලි, විෂ, රත්පිත්, උමතු ගති, ක්ලාන්ත නසාලයි.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

මෙහි පහත දක්වෙන යෝග ද විෂ සඳහා යෙදීමෙන් ඒ විෂ නිර් විෂ භාවයට පැමිණේ.

(i) වරකා ගසේ පනාමල් (කොස් ගැට) තනකිරෙන් අඹරා ඊට දිය කර දෙන්නේය. නවයක් දැවිලි, උමතු, ක්ලාන්ත දුරු වෙයි.

(ii) පුසුල් එල යුස, තනකිරි, කිතුල් පැණි හෝ හකුරු සමඟ දෙන්නේය.

(iii) ස්වර්ණ මාක්ෂිකා භස්ම රති 1 යි, ලුණු පස මංචාඩි 2 බැගින් – සුදු හඳුන් ගලගා කලං ½ යි, වැල් මී ගලගා කලං ½ යි, තන කිරි පුසුල් යුස අවුන්ස 2 බැගින්, මිශ්‍ර කර දෙන්නේය. සියලු විෂ සමනය වේ.

(iv) පුසුල් ගෙඩියක ඇස්ස කපා–මද ගෙන එය මිරිකා, කපු කොළ යුස – දිවි පහුරු කොළ යුස – තනකිරි පුසුලට යොද – බුලත් තටුව තනා – එහි තබා 108 වරක් නව ගුණ ගාථාවෙන් මතුරා දෙන්නේය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

සූනියන් විෂ – ඉනා විෂ – පපුවේ දැවිලි – දිවිමකුළුවන් කෑ විෂ – දූෂී විෂ (කාලාන්තරයෙකින් විපාක දෙන විෂ) සමනය වෙයි.

(v) නහුලේ හී විටේ රැඳුණු පස් වතුරේ දියකර බොන්නට දෙන්නේය – ඉනා බෙත් වලින් විෂ වූ විට මෙය යෙදීමෙන් ඉතා සතුටුදායක එල ඇත්තේය.

(vi) රතුලූනු, කුර මුල්, දෙළුම් ඇට, සුදු හඳුන් සමව එළකිරෙන් අඹරා ඊට දිය කර උණු ගන්වා දෙන්න, සියලු ආකාර විස සමනය වේ.

(vii) සුදු හඳුන්, වැල් මී, කුර මුල් කලං 4 බැගින්, ගෝවා කොළ කලං 12 යි, එළකිරි පතයි, තැඹිලි දිය පත 2 යි, නවසි දිය පත 5 යි, පතට සිඳ දෙන්න, සියලු විස සමනය වේ.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

විෂ කැවුණු අයට – පසුව හෝ දෙවන වර කරන විරේක සඳහා සුදුසුය.

(i) වැල් පෙනෙළ සහමුලින් කලං 24 ක් ගෙන, නවසි දිය පත 8 ක් වත් කර පතට සිඳ ගිතෙල් බහා දෙන්නේය.

(ii) තිපල් කසාය, තැඹිලි වතුරෙන් සිඳ ඇහැළ කරල් මද දිය කර දෙන්න.

(iii) වැල් පෙනෙළ කොළ, උලු හාල්, සුදු හඳුන්, රතුලූනු, උණු දියෙන් අඹරා, ඊට දිය කර, ගිතෙල් බහා දෙන්න.

ප්‍රස්ඵරක හෙවත් පොස්පරස් විෂ වූ රෝගීන්ට තෙල් වර්ග නොදෙන්නේය. එසේම කංසා විෂ වූ අයට පැණි වර්ග, හකුරු, සීනි නොදෙන්නේය. මඤ්ඤොක්කා විසට ඉඟුරු නොදෙන්නේය.

කිරිබදු අල, මඤ්ඤොක්කා අල, එළබිම් කඹුරු ආදී පලා වලින් ද විෂ වූ කල ද, අබින් විෂ වූ කල ද පැණි වර්ග– පැණි කැඳ – පැණි ආප්ප – ඉතා හොඳින් ගුණ ගෙන දේ.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

දැහක විෂ
CORRO SIVES

ද්‍රාවක – ගිනිවතුර (ACID)

වර්තමාන කාලයෙහි නා නා කර්මාන්ත සඳහා ඇසටික් ඇසිඩ් (acetic acid = සිර්කාම්ල) – ඔක්ෂලික් ඇසිඩ් (Oxalic Acid = ජම්බීරාම්ල)–කාබලික් ඇසිඩ් (Carbolic acid) ආදී ද්‍රාවකයෝ භාවිත කරනු ලැබෙත්. මේවා ශරීර ගතවීමෙන් ස්වාස්ථ්‍යයට බාධා ද – ඇතැම් විට මරණය ද වන්නේය.

ලක්ෂණ Symptoms

මේ ගිනි වතුර පානය කළ, කල මුඛය, ගල– නාලය, ආමාශය දක්වා වූ සෙම් පටලය දැවෙන්නේය. සම විවර්ණවේ. ද්‍රාවකය අධික වීමෙන් ආමාශය දැවී සමහර තැන් සිදුරුවේ. නිඃශ්වාසයෙන් ඒ ශරීර ගත වූ ද්‍රාවකයේ ගන්ධය පිට වෙයි. උදරයෙහි අත්‍යන්ත වේදනා ඇතිවේ. කථා කිරීමේ

හා ගිලීමේ අමාරු ඇතිවේ. හුස්ම ගැනීමට ද අමාරු වෙයි. ක්ලාන්ත, මූර්ච්ඡා, ශීතාංග අවස්ථා ඇතිව ඇතැම් විට මරණය වීම ද වේ. සමහර විට ආමාශයේ ද්‍රව්‍ය, කළුවන් වූ ලේ කැටි වමනය ද වේ.

ඇසිඩ් බීපු කෙනෙක්, නැවත සුව වූ පසු, එහි ඇති වූ වේදනා තත්ත්වය දන්නෙන්, නැවත කිසි දිනෙක හෝ ඇසිඩ් නොබොයි,

ප්‍රතිකාර
Treat ment

මුලදී මීට වමනය නොකර වන්නේය. ඇඹුල් වර්ගයන්ගේ විෂ නිර්විෂ කරන්නේ ක්ෂාර-යෙන් ය. ඒ නිසා, සෝඩා වතුර, හුණු වතුර, පුසුල් දිය, අලු කෙහෙල් අල යුස, කුඹුක් පොතු යුස, නවසි පොල් කිරි කහ සමග, පොල් සහ මා දම් පොතු කොටා මිරිකූ කිරි යන මේවා හැකි පමණ පොවන්නේය. කොරල් භෂ්මය ඩ්‍රැම් 1 ක් වතුර අවුන්ස 24 ට මිශ්‍ර කර - දිය කර පොවන්නේය. එසේම මුතු භෂ්ම - හක් අලු - කවඩි භෂ්ම ආදිය ද වතුරට දිය කර පොවන්නේය. නැතහොත් වතුර, පොල් කිරි, කුරුම්බා වතුර, නවසි වතුර ආදිය පුළුවන් තරම් පොවන්නේය. තල තෙල්, හුණු වතුර මිශ්‍ර කර පෙවීම ද යෝග්‍යය.

මුඛය පටන් මුළු පෝෂණ මාර්ගයේ දැවීමේ වේදනාව ඇතිවෙයි. එවිට මෙහි පහත දක්වෙන යෝග යෙදීමෙන් ඉක්මනින් දැවිල්ල සංසිඳෙයි.

(i) මා දම් පොතු, පැසුණු පොල් (නවසි පොල් නම් වඩා හොඳයි) කොටා හොඳට මිරිකා, අවුන්ස අටක් පොවන්නේය.

(ii) මුං ඇට, පැසුණු පොල් රන්වන් පාට වන තුරු බැද, කොටා මිරිකා බොන්නට දෙන්නේය.

මෙසේ ද්‍රාවකයාගේ සැර බාල වූ පසු වමනය කර වන්නේය. බින්නුග වලින් හෝ විලඳවැන්න වලින් හෝ වමනය කරවන්නේය.

විෂ වෙදකම කරන අය බින්නුග – විලඳවැන්න වෙලා තබා ගනිත් එළ කිරි බාගයකට විලඳවැන්න අහුරක් බහා, පොඩි කර පෙරා ගන්නේය. ඉතා සුප්‍රසිද්ධ වෛද්‍යවරු 'අසූචි' වතුරේ දිය කර පොවා වමනය කරවත්.

ආශ්වාසය අඩුවෙන බැව් පෙනේ නම් බාහිර උපක්‍රමයන් ගෙන් ආශ්වාස කරවන්නේය. මුව අං භෂ්ම රති 2 ක් මී පැණි, අලු කෙසෙල් යුෂින් දෙන්නේය.

මූර්ච්ඡා ආදිය ඇතිවූවොත්, හිම සාගර තෛලය – ශ්‍රී ගෝපාල තෛලය හෝ රත්පිත් තෛලයක් හිසට බහන්නේය. නාසයට ද උරවන්නේය, මඳක් විෂනීල තෛලය නස්‍ය කරන්නේය.

රත් පිත් උපද්‍රව ඇති වූ කල, 'රත්පිත්' චිකිත්සාවේ කසාය, ඝෘත ආදිය දෙන්නේය.

වමනය කරවීමෙන් පසු, විෂනීල තෛලයක් අවුන්ස ½ ක් දෙන්නේය.

මුඛයෙහි පටන් මුලු පෝෂණ මාර්ගයාගේ වණ ඇති වූ කල මෙහි දැක්වෙන තෙල පොවන්නේය.

කොවක්කා තෙල

කොවක්කා යුස – මා දම් පොතු යුස – තැඹිලි පොල් ලෙලි යුස – තෝරපත් යුස – අමු කහ යුස – උඳුපියලි යුස– දුම්මැල්ල යුස නැලිය බැගින්, නවසි පොල් තෙල් නැලියයි, නවසි පොල් කිරි නැලි 4 යි, කල්කයට – වැල් මී, ඉඟිනි ඇට, අරලු, සුදු හඳුන්, සැවැන්දන, තුවරලා, ජටාමාංස, භාතාවාරිය අල, කලං 4 බැගින්, අඹරා, මෘදුපාකයට තෙල සිඳ පෙරා ගන්නේය, මෙස හැඳි 1 බැගින්, මෙය පිලිස්සී මෙන් ඇඟ රෝගී වූ කල ද, මුහුණේ ඇසිඩ් වීසි වූ කල ද මෙය ගල්වන්නේය. දැවීම්, පිලිස්සුම් ද සුව වේ.

මේ තෙල දීමෙන් පසු, අරලු, බුලු, නෙල්ලි, වෙනිවැල් ගැට, උක් මුල්, කසාය මී පැණි දමා දෙන්නේය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ආහාර සඳහා එළ කිරි, මෝරු දිය, තණ හාල් කැඳ- කොහිල ගොටු දඹු හා රතුලූනු තැම්බූ දිය - පතෝල සුප්- දුම්මැල්ල සුප් ආදිය දෙන්නේය.

පසුව තරමක් සුව වී එන කල, බර ආහාර ගන්නට පුළුවන් වූ කල, ඉදුණු පේර හෝ අමු පේර හොඳට කොටා වතුරේ දිය කර, ඇට නො එන්නට පෙරා පානයට දෙන්නේය.

නැවත දිරණ සුලු සැහැල්ලු ආහාර දෙන්නේය.

ක්ෂාර වර්ග
ALKALOID

වොෂින් සෝඩා, කෝස්ටික් සෝඩා, ඇමෝනියා, සබන් ආදි ක්ෂාර වර්ග ද ශරීර ගත වේ. ඒ ක්ෂාර වර්ගයි.

ලක්ෂණ Symptoms වොෂින් සෝඩා ආදි ක්ෂාර කැවුණු - පෙවුණු විට - දිව තොල් ආදිය පිලිස්සී ගෝමාංසයන්ගේ ආකාර පෙනීම ඇතිවේ. ඔක්කාරය, පාචනය, හුස්ම ගැනීමේ අපහසුව, ක්ලාන්ත ආදිය ඇති වේ.

ප්‍රතිකාර Treatment විනාකිරි හෝ දෙහි ඇඹුල් මේස හැඳි 2 ක් බහා, වතුර පතක් මුලින්ම දෙන්නේය, ඉක්බිති, ඇඹුල් වර්ගයක් දමා වතුර පුළුවන් තරම් පොවන්නේය. නවසි පොල් සහ අලු කෙහෙල් අල කොටා මිරිකූ යුස ද ක්ෂාර විසටත් යෝග්‍යය. ඉක්බිති විෂනාසක තෙලක් දී, සැර බාල වූ පයු තිත්ත වැටකොළු හෝ තිත්ත ලබු කොළ හෝ කොටා - පොවා වමනය කරවනු. පසුව සෙම් සිටි දූවිලි, ඇතිවූවොත් කොවක්කා තෙල පානයට දෙන්න.

අක්මාවේ ඉදිමුම් ඇතිවූවොත් සුදු පිටවක්කා, ඇඹ- රල්ලා පොතු, කීකිරිදිය, බෝවිටියා, බක් මී පොතු, සම භාග ගෙන කොටා, නවසී වතුරෙන් මිරිකා, කකාරං පොවන්නේය.

අලු පුසුල් යුස - අලු කෙහෙල් අල යුස - කිකිරිඳිය යුස - කුඹුක් පත් යුස - මේවා ද හැකි පමණ දෙනු - විෂ නාශක ඝෘතද ටික ටික දෙන්න.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

රසාඤ්ජන

ANTIMONY, SALTS OF SUCH AS TARTAR EMETIES

ඇන්ටිමනි, ටාටරේට් ඇන්ටිමනි ආදී තන්ත්‍රාන්තරයන්හි දක්වෙන බෙහෙත් ද අධික ලෙස යෙදී මෙන් විෂ වේ.

ලක්ෂණ Symptoms මුඛයේ සහ දිවේ ඒ ධාතුවල වර්ණය සිටීම, ඒවායේ කෂාය රස දැනීම, අවිවේකය, අවිරාම වමන, ලාලා නිඃ සරණ, ජලවත් භේද ඇතිවේ. ඇතැම් විටෙක වමන පාචන දෙකම නැතිව තිබෙන්නට ද පුළුවන. ආක්ෂෙපය, සමෙහි වසන්ගත රෝගයෙහි මෙන් බිබිලි නැඟීම, මුඛාභ්‍යාභ්‍යන්තර ස්ලේෂ්මධරා කලාවෙහි ආරක්ත භාවය, ගලනාලයෙහි ද, මුඛාභ්‍යාභ්‍යන්තරයෙහි ද, ආමාශයෙහි ද, අන්ත්‍රයන්හි ද, වේදනා, පාකාශය, උදරය ආදියෙහි වේදනා, පාදයන්හි මස් පෙරළීම ආදී ලකුණු පහළ වේ.

චිකිත්සා Treatment ඉක්මනට වමනය කරවිය යුතු, වමනය හතර පස් වරක් ගිය පසු විෂ, නිර්විෂ භාවයට පමුණුවන ඉහත දක් වූ ද්‍රව්‍ය දෙන්නේය. පේර පත් යුස, අරලු කසාය, එළ කිරි, තන කිරි, පුසුල් යුස, කුර යුස ආදිය ඉතා හොඳින් ක්‍රියා කෙරේ.

ශීතල තෙලක් හිසට දමන්න. විෂ නසන ඝෘතයක් ද යොදන්න. ඇඟෙහි ද විෂ නාසක තෙලක් ගල්වන්න.

සංලක්ෂ්‍යය:- වමනය කරවීමට සුදුසු විස වර්ග වලට පවා - කලින්ම නිර්විෂ භාවයට පැමිණෙන බෙහෙතක් ඉක්මනින්ම දී - පසුව වමනය කර වීම සුදුසු යයි සුප්‍රසිද්ධ දක්ෂ දේශීය වෛද්‍යයයෝ පිළිගනිත්.

පාසානම්
ARSENIC AND ITS SALTS

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

පාසානම් සහ ඒ සම්බන්ධ අනෙක් ලවණ වර්ග ද නදබල ලෙස ශරීර ගත වීමෙන් විෂ වෙයි.

ලක්ෂණ
Symptoms

පාසානම් සහ එම සංයෝගයන් ගෙන් විෂ වූ කල තෘෂ්ණා (අධික පිපාසා) වමනය, පාචනය, ආමාශයෙහි වේදනා හා පසුව ක්ලාන්තය ද ඇති වේ.

චිකිත්සා
Treatment

ඉක්මනින් ම වමනය කරවන්නේය. විෂ නිර් විෂ භාවයට පමුණු වන, ඉහතින් දක් වූ අලු කෙහෙල් යුස, පුසුල් යුස, තනකිරි, එළ කිරි ආදිය දෙන ගමන්ම ද වමනය කරවන්නේය. මහා විෂතිල තෛලය නරමුත්‍ර වලට බහා පොවන්නේය. නවසි වතුර, විෂ නාශක ඝෘත ආදිය දී පසුව විරේක කරන්නේය.

ක්ලාන්තයට:– කුඹුක් කොළ තම්බා, කිරි සීනි දමා දෙන්නේය. මුව අං භෂ්ම රති 1 ක් මීයෙන් තන කිරි සමග දෙන්නේය.

එළ කිරි, තන කිරි, නවසි පොල් කිරි, එම දිය, පුළුවන් පමණ පොවන්නේය. කළු අරලු කිරි සමග කසාය දීමෙන් විරේක කරන්නේය.

1. පිච්ච දලු හෝ මල්, දෙළුම් දලු හෝ මල්, සුදු හඳුන්, ඉඟිනි ඇට, සමව අඹරා සියල්ල කලං 1½ ක් පමණ එළ කිරට දිය කර උණු ගන්වා පොවන්නේය. පාසානම් විස සමනය වේ.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ඊයම්
LEAD, SALTS OF

ඊයම් විෂ වූ කල්හි උගුරේ දැවිල්ල, ගලනාලයෙහි ශුෂ්කතා, මුඛ මද්ධ්‍යයෙහි ධාතව ආස්වාද, අත්‍යන්ත පිපාසා, උදරශූල සහ විශේෂයෙන් උදරයෙහි නාභිදේශයේ අත්‍යන්ත වේදනා ද ඇතිවෙයි. ශරීරය සීතල වෙයි. දහඩිය දමයි. ආක්ෂේපය සහ ක්‍රමයෙන් පක්ෂඝාතය ද වෙයි.

චිකිත්සා
Treatment

ප්‍රථම කොට වමනය කරවා, නිර්විෂ භාවයට පමුණුවන යූස වර්ග දී නැවතත් වමනය කරවන්නේය. නැත හොත් ආමාශය ශෝධනය කරවන්නේය. එළ කිරි, බාර්ලි වතුර, තන කිරි, මුං ඇට වතුර, දෙළුම් යූස, දුම්මැල්ල තැම්බූ වතුර, කුර යූස, නවසි කහකඩ යූස, කහ යූස, කරල්හැබ යූස ආදි නිර්විෂ පමුණුවන දේ දෙන්නේය.

ශරීරයේ වාත නාසක තෙල්, (ශ්‍රී ගෝපාල, හිම සාගර, ආදිය) ගල්ලන්නේය. බඩේ වේදනා අඩු කිරීමට චිත්‍රකරඤ්ජ තෛලය දී පසුව බෙලි, බැබිල, කොත්තමල්ලි කසාය දෙන්නේය. පසුව වේදනාව නොනවතින්නේ නම් අභිඵේනාසවය හෝ මධු පුෂ්පාසවය දෙන්නේය. පසුව තිපල් කසායෙන් විරේක කරන්නේය. දිය ලබු, පුසුල් තම්බා දෙන්නේය.

ඊයම් විෂ නිසා පක්ෂඝාතය ඇති වූ කල, කලින් නිර්විෂ භාවයට පත් කරන ඔසු දී, ඊ ළඟට පක්ෂඝාතයට පිළියන් කරන්නේය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

රසදිය
MERCURY & ITS SALTS

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

රසදිය හා ඒ හා සම්බන්ධ භෂ්ම රස කර්පූර, රස හින්දුර ආදියෙන් ශරීරය විෂ වූ කල නිමන ශාඛායෙහි වේදනා, වමන, ශරීරයෙහි දහඩිය දැමීම, ශීතල, නාඩීන් ගේ දුැක ගාමිත්වය, හෝ ක්ෂීණත්වය, උගුරේ දැවිල්ල, පාචනය ආදී ලක්ෂණයෝ පහළ වෙත්.

පසුවන කල දත් කැක්කුම ද, දත් වැටීම ද, පලු මතු වීම ද වන්නේ ය.

විකිත්සා (Treatment)

ඉක්මනින් වමනය කරවන්නේ ය. ඉක්බිති එළකිරි, තනකිරි, ගිතෙල්, දෙළුම් යුස, විෂ නාසක සෘත, ආදී නිර්විෂ භාවයට පමුණුවන ද්‍රව්‍ය දෙන්නේ ය.

ශුද්ධ කරන ලද නෙල්ලික්කා ගෙන්දගම් වරකට රති. 2 සිට 6 දක්වා, ගිතෙල් සමග හෝ ඒ වේලාවෙම දෙවූ අමු එළකිරි සමග හෝ දෙළුම් යුස සමග හෝ දෙන්නේ ය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

රසදිය බෙහෙත් වශයෙන් අධිකව ගැනීමෙන් ද, අමු රසදිය ශරීර ගතවීමෙන් ද පසුවට දත්වල රෝග, ලෙයෙහි දෝෂ, කුෂ්ඨ, ආදිය ඇති වේ. එවිට නිතර දත් සහ කට මූනමල් පොතු කසායෙන් සෝදන්නේ ය. කෝවක්කා ස්වරස අවුන්ස 2 බැගින් දවසකට දෙවරක් රසදිය පිටවන තුරු බොන්නේ ය. මෙය බොන විට මූත්‍ර මාර්ගයෙන් රසදිය පිට වෙයි.

ඉක්බිති ශුද්ධ කළ නෙල්ලික්කා ගෙන්දගම් පෙර පරිද්දෙන් බොන්නේ ය. නැවත අමෘතාදී මහ කසාය හෝ එම අරිෂ්ඨය පානය කරන්නේ ය.

රසසින්දූර හෝ මකරධ්වජය අධිකව ගැනීමෙන් ඇති වූ උපද්‍රවනට ගිතෙල්, එළකිරි, මුං තැම්බූ වතුර, දෙඩම් යුස, දූම්මැල්ල තැම්බූ වතුර දෙන්නේ ය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ප්‍රකාශද - ඌස්එරක
PHOSPHORUS, RAT - PASTE, MATCHES

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

පොස්පරස් කෑමෙන් විෂ වුණු කල මුඛයෙන් සහ නාසයෙන් සුදු ලූනු ගඳට හුරු පොස්පරස් ගඳ පිටවෙයි. ගලනාලි, පාකාශය, යකෘත ආදී ප්‍රදෙශයන්හි ජ්වාල ජනක වේදනා ඇති වේ. ප්‍රබල තෘෂ්ණා, වමන, ඇති වේ. මුලින් භුක්ත පදර්ථ සහ සෙම් ද පසුව පිත්ත සහ කෘෂ්ණා භ රක්ත මිශ්‍රිත ද්‍රව්‍ය ද පිට වෙයි. වමනය වන ද්‍රව්‍ය අන්ධකාර ස්ථානයකට ගෙන ගිය කල දිලිසේ.

චිකිත්සා (Treatment)

මීට තෙල් වර්ග නො පොවන්නේ ය. වමනය කර වන්නේ ය. ශුද්ධ පල්මාණික්කන් වලින් වමනය කර වන්නේ ය. පසුව නිර්විෂ භාවයට පමුණුවන ද්‍රවයද තිපල් කසායට ඇහැළ පැණි යොද විරේකයක් ද දෙන්නේ ය.

ලෝහ තෙල්
PARAFFIN, PETROLEUM PETROL

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

පැරපින්, පැට්‍රෝල්, භූමිතෙල් ආදී ලෝහ තෙල් ශරීර ගත වීමෙන් විෂ වූ කල තෙලේ ගඳ වහනය වෙයි. පිපාසාව, අවිවේකත්වය, ශරීරය ශීත වීම, මුහුණ දුර්වර්ණ වීම, හුස්ම ගැනීමේ අමාරු කම වෙයි. පසුව මූර්ඡා වෙයි.

චිකිත්සා (Treatment)

වමනය කරවීමෙකින් හෝ වෙන ක්‍රමයෙකින් හෝ ආමාශය ශෝධනය කරන්නේ ය. ඉක්බිති පොල් කිරි කහ සහ රතුලූනු යුස මිශ්‍ර කර පොවන්නේ ය.

හෘදය උත්තේජක ද්‍රව්‍ය ද වුවමනා විට යොදන්නේ ය.

තිපල් කසාය නවසි වතුරෙන් සාද දී විරේක කරන්නේ ය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

රතුලූනු යුස අවුන්ස 2 ක් වතුර අවුන්ස 8 ට දී, පසුව වමනය කිරීම ද යෝග්‍යය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

අයොඩින්
IODINE

අධික ලෙස අයොඩින් පානයෙන් ගලනාලයෙහි සහ ආමාශයෙහි උෂ්ණතා, හා දහ ඇති වෙයි. අධික පිපාසාව ඇති වෙයි. භේද, වමන ඇති වේ, වමන ද්‍රව්‍ය වල අයඩින් ගන්ධය ඇති වෙයි. පිෂ්ඨ ධාතු (බත් ආදිය) දම් පාටට හැරී තිබේ. අත්‍යන්ත තෘෂ්ණා, ඇතැම් විට රක්ත ස්‍රාවනය, ශිරෝ ඝූර්ණන, අචෛතන්‍යය, අස්ථිර තා, මූර්ඡා, සාර්වාංගික දෞර්වල්‍යය, ආලස්‍ය, කම්පානාඩි ශූල, ප්‍රලාප, ආක්ෂෙප හා අන්තයෙහි මරණය වෙයි.

චිකිත්සා (Treatment)

අමාශය සංශොධනය කරන්නේ ය. ඉක්බිති නිර්විෂ භාවයට පමුණුවන ද්‍රව්‍ය දෙන්නේ ය. නවසි වතුර, කුර යුස, එළකිරි, පේර ගෙඩි යුස, තන කිරි, පනා පට්ටා යුස, බහුල ලෙස යොදන්නේ ය.

ශ්වාස කුඨාර රසය ආඝ්‍රාණයට දෙන්නේ ය. කාඩි නො වූ උශීරාසවය, චන්දනාසවය ද ඉතා යෝග්‍යය. ගෝ මූත්‍ර ද නර මූත්‍ර ද ඉතා යෝග්‍යය,

1. කුර තම්පලා සහ මුලින් ගෙන කොටා පොල් කිරෙන් මිරිකා දෙහි ඇඹුල් සමග දෙන්නේ ය.

2. කුර මුල් රතුලූනු නවසි පොල් සම භාග ගෙන කොටා මිරිකා ගිතෙල් දමා දෙන්න.

අබින් – මෝපියා
Opium, Battley's Solution, Chlorodyne, Codeine, Dionin, D0ver's Pawder, Heroin, Laudanum, Morphine, Nepenthe, Paregoric

අධික ලෙස අබින් සහ අබින් සංයෝග ශරීර ගත වූ කල විෂ වේ. අබින් අධික පරිමාණයක් සේව–රි කියන මෙන් ඉක්මනින් මාදක ක්‍රියා ප්‍රකාශ වෙයි. සිත ප්‍රීතියෙන් හෝ කෞතුක භාවයෙන් සිට නිදිමත ගතියට පැමිණේ. තදින් නින්ද යයි. සිහියන් නැති වෙයි. මුඛය මලිනය වේ.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

සෙම්න් නාඩි වැටෙයි. සෙමින් දීර්ඝ ලෙස හුස්ම වැටෙ. ගොරවයි. ප්‍රශ්වාස වාතයෙන් අබින් ගඳ හෙවත් පුස් ගඳ ඇති වෙ. කළු ඉංග්‍රියාව අල්පෙනෙත්ති තුඩක් මෙන් කුඩා වෙ. ඇස් මඳක් රක්ත වර්ණ වෙයි. අර්ධ නිමිලිත හෝ මුද්‍රිත වෙයි.

චිකිත්සා (Treatment)

එළකිරි වලට පොල් පැණි හෝ කිතුල් පැණි බහා, පුළුවන් තරම් පොවා, පසුව වමනය කරවන්නේ ය. වමනය කර වීමෙන් පසු නිර්විෂ භාවයට පමුණුවන එළ කිරි හා පැණි, ගිතෙල්, පැණි සමග පේර කොළ කැඳ, ආදිය දෙන්නේ ය. කන්කුන් යුස කිතුල් පැණි සමග දෙන්නේ ය. ගිතෙල් ද පොවන්නේ ය.

මල බද්ධ ගතියෙන් තිබෙ නම් වස්තියක් යොදන්න.

කන්කුන් තැම්බූ වතුර පැණි සමග පොවනු. හෘදය උත්තේජ කරවීමට පැණි සමග කෝපි කෝප්පයක් දෙනු. ආශ්වාස ප්‍රාශ්වාසය දුර්වලවන විට බාහිර උපක්‍රමයන් ගෙන් ඒ කර වන්න.

හෘදය දුර්වල වෙමින් එන්නේ නම් – මෘත සංජීවනී සුරාවට කස්තුරි රති ½ ක් බහා දෙන්නේ ය. අර්ජුනාරිෂ්ටද ටික ටික දෙන්නේ ය. උණු කෝපි කිතුල් පැණි සමග දෙන්නේ ය.

කෑම පුළුවන් වූ විට පැණි ආප්ප, කන්නට දෙන්න.

1. කුර මුල් රතුලූනු අලුකෙසෙල් අල කොටා මිරිකා තැඹිලි වතුරෙන් හෝ නවසි වතුරෙන් මිරිකා, පැණි දමා දෙනු.

2. කුර, අලුකෙසෙල් අල, දමින්න පොතු, රතුලූනු, පුහුල් මදා කොටා, එළකිරෙන් මිරිකා, කිතුල් පැණි දමා දෙනු. අබින් හා වෙනත් විෂ සමනය වේ.

3. පේර කොළ කලටි පොල් දමා කොටා කලටි වතුරෙන් මිරිකා කිතුල් පැණි හෝ පොල් පැණි හෝ දමා දෙන්න.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ක්ලෝරල් හෙඩරේට ආදී නින්ද යාමට භාවිත කරන පාශ්වාන

ඖෂධ

CHLORAL

නින්ද යාමට දෙන ක්ලෝරල් ආදී බෙහෙත් මාත්‍රාව අධිකව යෙදීමෙන් විපාක්ක වෙයි, එවිට නිදිමත ගතිය, සැප එහසුවක් දැනීම, තද නින්ද, හා සිහිය නැතිවීම වේ. නාඩි ගති ප්‍රථමයෙන් ඉක්මන්ව, පසුව ක්ෂීණ වෙයි. සර්වාංගය ශීතල වේ. ශරීර තාපය අංශක 92° සිට 91° දක්වා පහළ බයි. නිශ්වාස වාතයෙහි බෙහෙත් ද්‍රව්‍යයේ ගන්ධ ඇති වේ. ශ්වාස, හෘද් ක්‍රියා අභාවය වීමෙන් මරණය පවා වෙයි.

ප්‍රතිකාර (Traetment)

රෝගියා වමනය කර වන්නේ ය. නැතහොත් ඔහු ගේ ආමාශය ශෝධනය කරන්නේ ය. මූනට බෙල්ලට හිසට තුවායක් තෙමා හෙලන්නේ ය. ශරීරය පලසෙකින් උණුසුම් වන ලෙස වසන්නේ ය. උණු වතුර බෝතල ළඟ තබන්නේ ය. ඉඟුරු යුෂ කිතුල් පැණියෙන් වෘහත් කස්තූරි හෛරවය දෙන්නේ ය. එළකිරි, කිතුල් පැණි දමා කෝපි කෝප්පයක් දෙන්නේ ය.

ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, කොත්තමල්ලි, බැබිල මුල්, අමුක්කරා, සාරණ, ලූණුවිල, කොකුම් පොතු, සුවඳ කොට්ටන් කසාය, එළකිරි පතක් ද වතුර පත 3 ක් ද බහා පතට සිඳ දෙන්නේ ය.

හිසට ශ්‍රී ගෝපාල තෛලය යොදනු, නාසයට විෂ නසන තෙලක් නස්‍ය කරන්න.

1. අලු කෙහෙල් මුහ රතුලූනු නැඹිලි මල් කොටා, තම්බා, මීරිකා, ගිතෙල් බහා දෙන්න.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

තඹ, පල්මාණික්කම් ආදිය
COPPER, SALTS OF VERDIGRIS, BLUE VITRIOL

තඹ සංයෝගයන් ගෙන් ශරීරය විෂ වූ කල්හි මුඛයෙහි ඒ ධාතුන්ගේ ආස්වාදය, උගුරේ වියලීම, පාකාශයෙහි සූචිවේධවත් වේදනා, නිල හෝ නිල්වන් වමන, කෙළ ගැසීම, දුතනාඩී, අතිශය උත්සාහයෙන් මල භේදය, ඇතැම් විට මූත්‍රරෝධය ප්‍රශ්වාස ශ්වාසයා ගේ ඉක්මන් කම ප්‍රබල කාෂ්ණා, ශාඛා සමූහයාගේ ශීත (අත් පා සිතලවීම) සම්යුක්ත ශිරඃ පීඩා, ශිරෝ ඝූර්ණන, අමෙච කනාසය, යන ලක්ෂණ පහළ වේ. නැවත මරණය ද වේ.

චිකිත්සා (Treatment)

වමනය කරවීමෙන් හෝ නලයෙන් හෝ ආමාශය ශෝධනය කරන්නෝ ය. ඉක්බිති නිර්විෂ භාවයට පමුණු වන බාර්ලි කැඳ, අරලුප්පිටි කැඳ, එළකිරි, තන කිරි, පුසුල් යුස, කුර යුස, ගිතෙල් ආදිය ද පිත නසන සෘතද දෙන්නේ ය. තිපල් කසායට ගිතෙල් බහා දී එයින් විරේක කරවන්නේ ය. සුදුලූනු එළකිරෙන් තම්බා දෙන්නෝ ය.

1. කුර මුල්, රතුලූනු, පුසුල් මද, අලු කෙහෙල් අල, කොටා තැම්බී දියෙන මිරිකා කකාරා දෙන්න.

කාබන් මොනඔක්සයිඩ්
CARBON MONOXIDE

අධිකව කාබන් මොනඔක්සයිඩ් ශරීර ගත වීමෙන් නිදිමද ගතිය, තද නින්ද, ශරීරයේ දීප්තියක් ඇතිවීම යන ලක්ෂණ පහළ වේ.

ප්‍රතිකාර (Treatment)

අම්ලකර පූරවෑන් තරම ලබා දෙන්නෝ ය. හුස්ම ගැනීම නැවතුණ හොත් බාහිර උපක්‍රමයෙන් ඒ කරන්නේය. ලෙඩා උණුසුම කරන්නේ ය. වාහත් කස්තුරි හෙරවය රසය තන කිරෙන් යොදන්නේ ය.

බැලඩෝනා – ඇට්‍රොපින්
BALLADONA, ATROPINE

ලිනිමන්ට ආදිය වරදවා පානය කිරීමෙන් මේවා ශරීර ගත වෙයි.

ලක්ෂණ (Symptoms)

මේවා විෂ වූ කල මුඛ, උගුර, දිව ආදියෙහි උෂ්ණතා, අත්‍යන්ත තෘෂ්ණා (පිපාසා), කලබල ගතිය, ගිලීමේ අමාරුව මුඛ මණ්ඩලය රක්ත වර්ණ වීම, ඇස් දූවිල්ල සහ රතුවන් වීම, ද්වි දෘෂ්ටි, කළු ඉංග්‍රියාව පළල් වීම, ආලෝකයෙන් ඒ වෙනස් වීම, මුඛගලය වියලීම, සිහිමද ගතියෙන් රෙදි ඇද දැමීම, තද නින්දට පත්වීම, ඇඟේ රතු පාට පැල්ලන් මතුවීම, යනාදිය ඇති වේ.

ප්‍රතිකාර (Treatment)

මුලදී වමනය කර වන්නේ ය. තදට වන් කල කෝපි කිරි දමා දෙන්නේ ය. තනකිරි දෙන්නේ ය. පේර කොළ පොල් දමා කැඳ පිස පැණි දමා දෙන්නේ ය. රත්පිත් කසාය හා යුෂ දෙන්නේ ය. විෂ නාසක ඝෘත යොදන්නේ ය,

ගොඩකදුරු – ස්ට්‍රිච්නින්
NUX - VOMICA, STRYCHNINE

ගොඩ කදුරු ද ඉන් සම්පාදනය කරන ලද ක්ෂාරද අධික ලෙස ශරීර ගත වීමෙන් කට තිත්ත වීම, හුස්ම හිරවීම පේශීන්ගේ දැඩි ගතිය, දැහලීම, මුළු ශරීරයේ ගැස්ම (ආක්ෂෙපය), හනු තදවීම, ආරුක්කුවක් මෙන් ශරීරය හැඩ ගැසීම, සිහි නැතිවීම යන ලකුණු ඇති වේ.

ප්‍රතිකාර (Treatment)

ගැස්ම හට ගැනීමට පළමුව වමනය කරවා නාර්විෂ භාවයට පමුණුවන ද්‍රව වර්ග පුළුවන් තරම් දෙන්නේ ය. රෝගියා නිශ්චලව තබන්නේය. තරළුණු, විෂනාශක තෙල්, ගිතෙල්, තනකිරි, පුසුල් යුෂ, හැකි තරම් පොවන්නේය. හිම සාගර තෛලය ඇඟ ගල්ලන්න.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ඉඳිබොඩ, රඹුක්බොඩ, අමු ඉඟුරු, රතුලූනු කොටා යුස ගෙන තනකිරි ගිතෙල් දමා පොවන්න.

අශූචි නරමූත්‍රයෙහි දියකර මුලින්ම පෙවීම යෝග්‍යය. ඊට වමනය ද යන්නේ ය.

1. සුදු හඳුන්, වැල්මී, ඉඟිනි ඇට, කුර මුල්, අලු කෙහෙල් අල, රතුලූනු, නෙල්ලි, පිටවක්කා, කෝමාරිකා මද, දමින්න පට්ට වැල්පෙනෙල මුල් තැඹිලි දියෙන් කකාරා, ගිතෙල් දමා දෙන්නේ ය.

2. පුසුල් මද කුර මුල් කොටා එළකිරෙන් මිරිකා කකාරා බොන්නට දෙන්න.

3. කෙහෙල් මුහ යුස, ජම්බු පල යුස කිරි සමග දෙන්න.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

වච්චනාවි
ACONITE

වච්චනාවි විෂ වූ කල මුඛ විරස, දිව, පාකාශය උෂ්ණක හෙවත් දහය ඇතිවීම, තොල් පුපුරු ගැසීම, ක්‍රමයෙන් ශරීරයේ සෑම තැනම දහ ගතිය, කෙළ වැගිරීම හා පසුව වමනය වීමත් වෙයි. ඇතැම් විටෙක වමනය නො වේ. ශරීරයේ ස්පර්ශ ශක්තිය හීන වේ. බිහිරි වෙයි. දෘෂ්ටි විකාර, කථා කිරීමේ අසමර්ථ භාවය වේ. හුස්ම ගැනීම අතිශයින් කෂ්ට වෙයි. නාඩි ක්ෂීණ විෂම ගති ඇති වේ. මල භේදය වේ, දහඩියද දමයි. හෘද් විරතිය ඇතිව අන්තිමේ මරණයත් වෙයි.

ප්‍රතිකාර (Treatment)

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

වමනය කරවා විෂ නිර්විෂ භාවයට පමුණුවන ද්‍රව්‍ය හැකි පමණ දෙන්නේ ය. නරමූත්‍ර, ගෝමූත්‍ර, තනකිරි, පුහුල් යුස, අලු කෙහෙල් අල යුස, කුර යුස, ආදිය දෙන්නේ ය. විෂ නාශක ඝෘත – විෂ නාශක තෙල් දෙන්නේ ය. අගද තනකිරෙන් හෝ සුදුසු යුසයකින් දෙන්නේ ය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ප්‍රසික් ඇසිඩ් – සයිය නිඩ්
PRUSSIC ACID, CYANIDES & HYDRO CYANIC ACID

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ප්‍රසික් ඇසිඩ් සයියනිඩ් ආදිය විෂ වූ කල ඉක්මනින් සිහි නැති වෙයි. මෙය එක් වරක් අමාරු වූවාට පසු ද වෙයි. තදින් හනු පුටවු වේ. ගැහි ගැහි සෙමින් හුස්ම වැටේ. ඇමන් හෙවත් රට කොට්ටන් මද වලින් පිට වෙන ගඳට සමාන ගඳක් පිට වේ. සම ශීතල වේ. ඇස් වල නෙරන ගතියක් ඇති වේ.

ප්‍රතිකාර (Treatment)

මුහුණටද බෙල්ල පිටිපසට ද ඇල් දිය ගසන්නේ ය. නාස්පුඩු වලට තවසාරන් වායුව අල්ලන්නේ ය. විෂ නාශක තෙල් අවුන්සයක් පොවා පසුව වමනය කර වන්නේ ය, නාසයට ද ඒ තෙල් නස්‍ය කරන්නේ ය.

නිර්විෂ භාවයට පමුණුවන ද්‍රව්‍ය දෙන්නේ ය. මාංග මදසවය තනකිරි දමා ටික ටික දෙන්නේ ය, නරමුත්‍ර තනකිරි – හැකි පමණ දෙන්නේ ය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

පිදී තුත්තත්
Zinc salts of

පිදී තුත්තත් විෂ වූ කල්හි මුඛාභ්‍යන්තරයෙහි ශෛලවධාරා කලාවගේ ප්‍රදහය, මුඛයෙහි පටන් පාකස්ථලී පර්යන්ත ඒකප්‍රකාර ජ්වාල ජනක වේදනා ඇති වේ. සෙම් හා ලේ මිශ්‍ර වමනය, ගිලීමේ අමාරුව, ශ්වාස–ප්‍රශ්වාස හා නාඩිගති අතිශයින් ඉක්මන්වීම, හුස්ම ගැනීමේ අමාරුව, කළු ඉංගිරියාව පුළුල්වීම, අවසන්තකා, සිහි–නැතිව යාම, ආදි ලක්ෂණ ඇති වේ.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

චිකිත්සා (Treatment)

කිරි, ගිතෙල් මුලින් දී ඒ එක්කම වමනය කරවන්නේය. පසුව විෂ නිර්විෂ භාවයට පමුණුවන ද්‍රව්‍ය දෙන්නේ ය. තිපල් කසාය ගිතෙල් හෝ විෂනාශක තෙල් දමා දෙන්නේ ය. විෂනාසක ශාතයක් දෙන්න. සියිල් ඇද දෙන්නේය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ජයපාල බීජ
CROTON

ජයපාල බීජ, ජයපාල අඩංගු බෙහෙත්, ජයපාල තෙල් ආදිය අනිසි ලෙස හෝ අධිකව ශරීර ගතවීමෙන් විෂ වෙයි. උදරයෙහි ක්‍රමගත වේදනා, වමන, ජලවත්මද භේද ඇතිවේ. මුඛ මණ්ඩලය පාණ්ඩු වර්ණ වේ. නාඩික්ෂීණ වේ. ශරීරය උෂ්ණ ඇතිව දහ ගති ඇතිවේ.

ආහාර මාර්ගයේ ම දැවිල්ලක් හට ගනී.

චිකිත්සා (Treat ment)

අධික ලෙස විෂවීමක් නම් වමනය කරවා නිර්විෂ-භාවයට පමුණුවන ද්‍රව වර්ග දෙන්නේ ය. සුළු ප්‍රමාණයක විෂවීමක් නම් නිර්විෂභාවයට යුස වර්ග පමණක් දෙන්නේ ය.

කුර යුස – කොහිල අල යුස – කටුපෙඳ (තුන්කටු) යුස හෝ කසාය – තනකිරි – ඉතාම මීට යෝග්‍යය. මේවා ලැබුණු පමණක් බහුලව දෙන්න. කොහිල අල, ගොටු දඬු, රතුලූනු සමභාග ගෙන කොටා කඩ පිඹමෙන් තම්බා මිරිකා තනකිරි ගිතෙල් දමා දෙන්නේ ය. බැදපු මුං ඇට තම්බා දෙන්නේ ය. විෂනාසක ඝෘත ද දෙන්නේ ය.

ජාපාල අඩංගු බෙහෙතකට බඩඑලිය නොගොස් බඩේ පපුවේ දැවිල්ල ඇතිව උදාවර්තව, බඩේ පිපුළක් ඇතිවූ කල, කුරුම්බා වතුර, තැලිඹි වතුර, නවසි වතුර, හා දුම්මැල්ල හා කොත්තමල්ලි තැම්බූ වතුරද දෙන්නේ ය. එවිට සමනය නුවූවහොත් කුරමුල් කසාය හෝ ස්වරසදී වමනය කරවා තිපල් කසාය ගිතෙල් බහා දෙන්නේ ය.

ඇගේ වැඩි අමාරුවක් නැතිව, දැවිල්ලත් සමග බඩඑළිය යන්නට පටන් ගතහොත්, තනකිරි පුළුවන් තරම් දෙන්න, කොහිල අල, කුර, අලු කෙහෙල් අල, මේවායේ ස්වරස තනකිරි සමග දෙන්න, නවසි වතුර, නවසි කහකඩ යුස දෙන්න. නැවත අමු ඉඟුරු උණු අලුවෙන් තම්බා මීපැණි සමග අඹරා දෙන්න.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

අමු ඉඟුරු යුෂ -මීපැණි – තනකිරෙන් ගුලියක් දෙන්න.

1. එළකිරි පතකට සුදුහඳුන් කලං 1½ ක් ගලගා දමා දෙන්න, එසේම තැඹිලි වතුරෙන් හඳුන් ගලගා දෙන්න, ජාපාල විස ඇරේ.

2. එළකිරි, අලුපුහුල් යුෂ, සමව ගෙන සඳුන් ගලගා දමා කකාරා පොවන්න. ලොද සහිත කුරුම්බා වතුර ලොදත් සමග දෙන්න.

අත්තන ඇට
STRAMONIUM DATURA ETC.

අත්තන ගසේ සියල්ලෙන්ම විසවිය හැකියි. එයින් විෂ වූ කල අවිරාම ගතිය ඇති වේ. ප්‍රකෘති සිහිය නැතිවී සිනාසීම් විකාර කිරීම් ආදිය ඇති වේ.

චිකිත්සා (Treatment)

වමනය කරවා විෂ නිර්විෂ භාවයට පමුණුවන ද්‍රව්‍ය දෙන්නේ ය. සුළුවට විෂවී නම් නිර්විෂ භාවයට පමුණුවන ද්‍රව්‍ය පමණක් දෙන්නේ ය. තනකිරි හුඟක් පොවන්නේ ය. එළකිරි, හිතෙල්, කුර යුෂ, කොහිල අල යුෂ, නවසිපොල් කිරි, නරමුත්‍ර, පුහුල් යුෂ, විෂනාශක ඝෘත ආදිය දෙන්නේ ය.

1. මුං ඇට, රතුලූනු පොල්කිරි දමා කැඳ පිස දෙන්න, අත්තන විස ඇරෙයි.

කංසා – ගංජා
CANABIS LNDICA

කංසා විෂවීමෙන් නානා අද්භූත දේ කරයි. සිනාසෙයි, වැඩියෙන් කථා කරයි, එක ක්‍රමයකට නො සිටී. බොහෝ කියවයි. ඉහළ ගස්වල, වහලවල් වල නැඟ නිශ්ශබ්දව සිටී. ඇතැම් විට දේශනා කරයි. ඇස් රතුවෙයි.

චිකිත්සා (Treatment)

වමනය කරවන්නේ ය. වඩා තද නැත්නම් කුරුම්බා කලටිවතුර සහ පොල්කිරි දුන්විට සමනය වේ.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

වළිනය කරවීමෙන් පසු සැලට් කුරුම්බා වතුර, පොල්කිරි, නවයි වතුර, නවසි පොල් කිරි, පුහුල් යුස, පේර යුස, පේර ගෙඩි, දෙන්නෝ ය, පසුව සීනි නැති සාතයක් දෙන්න.

උගුර වෙලෙන විට ගිතෙල් දෙන්න. පැණි රස නො දෙන්න, ඉක්කාව වේලුම ආවොත් ඇඹුල් කෙසෙල් කුරුල්ලන් ගේ යුස දෙන්න.

ඔලිඳ ඇට
GUNJA SEEDS

ඔළිඳ ඇට අනුභව කිරීමෙන් විසව, වමනය ද, පාචනය ද, ක්ලාන්තය ද, ආමාශයේ දැවිල්ලද ඇති වේ. කොලරාවේ ලකුණු පහළ වේ. හෘදය ද දුර්වල වේ.

චිකිත්සා (Treatment)

වමනය කරවා, නිර්විස භාවයට පමුණුවන ද්‍රව්‍ය දෙන්නෝ ය ගිතෙල් කිරි, කිරිකෝපි දෙන්නෝ ය. තිපල් කසාය, ගිතෙල් දමා දෙන්නෝ ය. පේර කොළ කැඳ කිතුල් පැණි දමා දෙන්නෝ ය. දෙළුම් යුස ද දෙන්නෝ ය.

වැට එරඬු ඇට
WILD CASTROROIL SEED

වැට එරඬු ඇට අනුභවයෙන් ළමයින්ට වමනයද ඇතැම් විට ලේ වමනයද, බඩේ වේදනාද, දැවිල්ලද පාචනයද වෙයි.

චිකිත්සා (Treatme nt)

තැඹිලි වතුර, නවසිවතුර, එළකිරි, තනකිරි ආදිය වමනය වන එක එක වරට පොවන්නෝ ය. වමනය නොවන්නේ නම් වමනය කරවන්නෝ ය. නිර්විසභාවයට පමුණුවන ද්‍රව්‍ය දී තිපල් කසායට ගිතෙල් දමා දී විරේක කරවන්නෝ ය. වැටකයා බොඩ, කොහිල අල, ගොටු දඹු රතුලූනු යුස, තනකිරි දමා දෙන්නෝය, කුර යුසද දෙන්න. තෙල් එරඬු ඇටවලින් විෂවීමටද මේ ප්‍රතිකාර යොදන්නෝය.

1. කිතුල් බඩ, වෙ බඩ, රඹුක්බොඩ, අමුඉඟුරු කොටා එළකිරෙන් මිරිකා, උණුකර පොවන්න.

හොඩලගෙඩි - නියගලා අල
PASSON, ROOTSETC

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

හොඩලගෙඩි, නියගලා අල, කැමෙන් වමනයද පාචනයද, දුවිල්ලද, ආමාශයේ වේදනාද, කැක්කුම් හා ක්ලාන්ත ආදිය ද ඇති වේ. තරුණයනට ආර්තව පිටවීම ද වෙයි.

චිකිත්සා (Treatmeut)

වමනය කරවන්නේ ය. ඉක්බිති විස නිර්විස භාවයට පමුණුවන එළකිරි, තනකිරි, පුහුල් යුස, පේරකොළ කැඳ පැණි සමග, දෙන්නේ ය. නරමුත්‍රද යෝග්‍යය. පසුව තිපල් කසායෙන් පැණි ගිතෙල් දමා විරේක කරවන්න.

i. හාතාවාරිය, කලාඳුරු අල, සැවැන්දන, කුර මුල්, වදකහ, අමුකහ, කොසඹ මුල්, මේවා කොටා, එළකිරෙන් මිරිකා දෙන්න.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ii. ගින්තඹල කොළ, පොතු, රතුලූනු, අමු ඉඟුරු යුස ගිතෙල් සමග, හොඩල කෑ විස නසා.

iii. කුරමුල්, නවසිපොල් සමග කොටා, මිරිකා, කකාරා දෙහි ඇඹුල් දමා දෙන්න. හොඩල කෑ විස සමනය වේ.

iv. ඉඟුරු, සුදුලූනු, කුරමුල්, නවසිපොල් සමභාග ගෙන කොටා, මිරිකා, කකාරා දෙහි ඇඹුල් දමා දීමෙන් නියගලා කෑ විස සමනය වේ.

හතුවර්ග
MUSHROOMS

ඇතැම් විස හතුවර්ග කැමෙන් වමනය, පාචනය, අරුචිය, බඩේ වේදනා, අටිරාටය ආදි ලකුණු ඇති වේ. තවද ඇතැම් හතුවර්ගයක් කෑමෙන් ශීතාසෙන්නට පටන් ගනී.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

චිකිත්සා

පේරපත් යුස පැණිදමා දෙනු. වමනය වන වන එක වරට පේරකොළ, කොත්තමල්ලි තම්බා, කිතුල්හකුරු හෝ පැණි දමා දෙනු. වමනය නොවුවොත් වමනය කරවන්න.

උදුපියලි යුස, කුරතම්පලා යුස, දෙළුම් යුස, දිවුල් යුස පැණි සමග, දෙන්නේ ය. පසුව තිපල් කසායට පැණි දමා දී විරේක කරවනු.

i. අලුකෙහෙල් අල, රතුලූනු, කිකිරිඳිය කොටා යුසගෙන කකාරා, ගිතෙල් දමන්න.

ii. කුරතම්පලා යුස, පොල්කිරි, දෙහි ඇඹුල්, කිතුල් පැණි සමග දෙන්නේ ය.

iii. රත්මල් කොළ, පොතු, අලුකෙහෙල් අල කොටා මිරිකා යුස ගෙන එපමණ එළකිරි දමා, උණුකර ගිතෙල් දමා පොවන්නේ බිම්මල් විස නසයි.

iv. තිප්පිලිමුල්, එළකටරොලුමුල්, කලාදුරු අල උණුදියෙන් අඹරා පොවනු. පාචනය වෙයි, විසද අඩු වේ.

සියලු වසවිස වලදී ඉක්කා ආවොත්, පැණිදොඩම් යුස, හීන්නාරන් යුස, දෙළුම් යුස, පේර යුස, මසන් යුස, තනකිරි මෙයින් ලැබුණු වර්ග වැඩිපුර දෙන්නේ ය. පේරපත්, කොත්තමල්ලි තම්බා දෙන්නේය. ඒවා විස–වීමෙන් පසු ඒ ද්‍රව්‍ය ගැන තද අප්‍රිය තාවයක් ඇත්නම් ඒ යුස වර්ගවලට කිතුල් පැණි දමා දෙන්නේ ය. (කංසා වලට පමණක් පැණි නොදෙන්න.) අබින්, හතුවර්ග, අලවර්ග, ගෙඩිවර්ග, පලාවර්ග විස වූ විට පැණි වර්ග ඉතා හොඳය. කුරයුස, සියලු විසවලට යෝග්‍යය, නවත්වන්නට බැරි වමනේට, සුදුහඳුන්, සැවැන්දන, කලගෙඩිය ඇතුළේ මණ්ඩි අඹරා වතුරට දියකර දෙන්නේ ය. නැතහොත් පේරගෙඩි යුස කිතුල් පැණි සමග දෙන්නේ ය. පාචනය අධික වුවොත් කුරමුල්, ගොටුදඹු, කොහිල අල, රතුලූනු, වැටකයා බොඩ, රතුලූනු මේවා කොටා කඩ-පිම්මෙන් තම්බා මිරිකා තනකිරි; දමා දෙන්නේ ය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

බොහෝ විෂවලට වමන කරවීමෙන් පසු තණහාල්, පොල්හකුරු අඹරා වතුරෙන් දියකර දෙනු ලැබේ.

විෂමුසු බත් බුලත් ආදිය සැපුවහුගේ හනු තදවීමද, කට පුපුරු ගැසීමද, කෙළ ගැසීමද, රස නොදැනීමද දත් හිරි වැටීමද, – අදර – දිව වසඟ නොවීමද – ඒවා සහ මුඛය ඉදිමී තොල් පෙරළීමද කථාව බැරිවීමද වේ.

එවිට ගෝමුත්‍ර — නරමුත්‍ර වලින් කටසෝද්ද, අගදයක් නරමුත්‍ර හෝ විෂනසන ද්‍රව්‍ය කකාරා දෙන්න.

විෂ ආමාශ ගත වූ කළ ධහදිය සෙලවීමද – මූර්ඡාවීම– මත්වීම බඩ පිපුම, සියැරුම – ලොමුදැහැගැන්ම – වමන – දහ - සිහිනුවණ අඩුවීම – ළය ඇසුරු ගැන්මද –අතුල් පතුල් ආදි හැමතැනින් බින්දු පිටවීමද වේ.

විෂය පක්වාස ගත වූ කල නොයෙක් පැහැ වූ වමනයද ආබස්‍යයද – මුත්‍රබහුල වීමද – සිරුර බල නැතිවීමද – උදරරෝග ද – පාචනය ද කෙරේ. ඇතැම් විට ලේ වමනය හා පාචනය ද වේ.

මෙකී ලකුණු දැක, අගදයක්, සුදුසු විෂ නසන ද්‍රව්‍ය සමග දී, වමන විරේචන කරන්න.

කහ, දුදු, නික, සීනි, රණවරා, වෙනිවැල්, ඊතණ, කුර, සන්නිනායන්, මෙයින් නස්‍ය, පාන, අංජන යොදන්න.

සාමාන්‍ය විෂවලට පුසුල් දඬු තම්බා අගදයක් දෙන්න.

කබර විෂ ආදියට නරමුත්‍ර සමග අගදයක් දෙනු.

වමන විරේචනයෙන් පසුව ස්වර්ණභෂ්ම රති ¼ය බැගින්, අගදයක් සමග කුරමුල් යුසින් දෙන්නේ ය.

ගැවුණු විෂට – විෂ ද්‍රව්‍ය ඇඟ ගැවුණු කල ඇඟ හැම තැන දහ ඇතිව පඩුවන් පාටට බිබිලි නැඟීම උණ ඇතිව ඉසකෙස් නියපොතු ගැළවීම වේ,

තගර (නුවරලා) සුවඳ කොට්ටන්, නෙබු අල, ලොධු නෙළුම්, සුදුහඳුන්, තලිස් පතුරු, සැවැන්දරා, ගිතෙලින් අඹරා ආලේප කරන්නේ, අගදයක් හෝ විෂනාශක තෙලක් නස්‍ය, පාන කරවන්න.

සුඹුනා ලද විෂට – විෂ ඉඩීමෙන්, ඉසදහලෙඩ, රුධිරය කිපී, ඉසරුජා, ඇති වේ. එවිට කැල, මොරයුස, බෝ දලු, නුග දලු, අට්ටික්කා දලු, කොටා එළකිරි, ගිතෙල් දමා, තෙල සිඳ නස්‍ය කරන්න, විසනාසක තෙලක් නස්‍ය කරන්න.

මඤ්ඤොක්කා මත්වීම සහ විෂවීම

මඤ්ඤොක්කා විෂවීමෙන් වන රෝග වලට ඉහුරු ඉතා නරකය. උම්බලකඩ, පැණි, හකුරු, පේර, මීට යෝග්‍යය. වමනය නොයන්නේ නම් වමන කරවා පසුව බෙත් දෙන්නේ ය.

බඩේ වේදනාව ඇතිවන විට i. ලිපේ යට රතුපස්, වතුරෙන් දියකර පෙරා, දෙහි ඇඹුල් කිතුල් පැණි ටිකක් සමග, වරින්වර පොවන්න. ii. දෙහි ගෙඩියකම කැටිලුණු තෝරපත්, අඹරා දමා, උණුඅලුවෙන් තම්බා, මිරිකා දෙන්නේ ය.

විෂ සමනය වීමට – පේරකොළ, කොත්තමල්ලි තම්බා, කිතුල් පැණි හෝ, කිතුල් හකුරු දමා දෙන්නේ ය.

කටින් බඩින් යාමට – බෙලිමුලේ ඇට මදය, විලද පේරකොළ තම්බා දෙන්න. පේරකොළ කොටා, කැඳට දමා පිස, පැණි, පොල්කිරි දමා දීමෙන් මඤ්ඤොක්කා විෂ සමනය වේ.

විෂ සංහාරක වටිය

ශුද්ධකළ සිවන්ගුරු, කහ ගැටකහ, (වෙනිවැල්ගැට), සුදුමදුරුතලාමල්, වැල්මී, ලාකඩ, සහිඳලුණු, ජටාමාංස, වාල්මොලභූ, පෙරුම්කායම්, කබරස මුල්, ඉරමුසුමුල්, තෙඹුඅල, තිකුළු, කුම්කුමප්පු, ගෝරෝචන, සමභාග, කැල යුසින් අඹරා ඇත්තිබ්බටු පමණ ගුලි කරන්නේ ය. මාත්‍රා – ගුලි 1 යි, ගුණ – සර්වප්‍රකාර විෂ, ඉදිමුම, ගුල්ම, සර්වරෝග, ස්වරභේද, කණ්ඨරෝග, කාශ, අරුචි, ඔක්කාර නසයි.

සියලු ආකාර විෂවලට තනකිරෙන්ද – එළකිරෙන්ද – වෙනත් ඒ ඒ අවස්ථාවට සුදුසු අනුපානෙන් ද දෙන්නේ ය.

ඉතා විෂවීමෙන් ක්ෂය රෝගයේ ලකුණු මෙන් ඇති රෝගීනට ද මෙය යොදන්නේ ය.

අමෘත ඝෘත

දිය නැලි 16 යි, එලුමුත්‍ර නැලි 24 යි, ගෝ මුත්‍ර නැලි 24 යි, ගිතෙල් නැලි 4 යි,, කල්කයට–මාරාපඤ්චාංගය, තිකුළු, රත්හඳුන්, නිල්මානෙල් අල, බැබිලමුල්, සිරිවැඩි–බැබිලමුල්, කබරසමුල්, කොහොඹපොතු, පළොල්මුල්, වදමල්, නියඳ අල, ආඩතෝඩාමුල්, මදුරුතලා, කෙළිඳ පොතු, දියමිත්ත, අමුක්කරා, වරාමුල්, වැල්මී, මදුරා, මදුරා අරටු, ගොන් කැකිරි, බටු, මුද්දරප්පලම්, රත්–කොබෝලිල, හාතාවාරිය අල, දූත්ත අල පොල්පලා රසාංසන, එළකටුරොළු, නිල්කටුරොලු, තෙබුඅල, දේවදර ප්‍රියංගු (රුක්මල්) කිරිබදු අල, මී ඇට, කරඳ ඇට, එම පොතු, කහ, ගැටකහ, වැල්පෙනෙල මුල්, ඒකාවෙරිය, රට–තෝර, රුක්හුණ, කටුමාරා, කරල්හැබ, කලං 4 බැගින් අඹරා බහා ගිතෙල් පදමට සිඳ පෙරා ගන්නේ ය.

මාත්‍රා – තේ හැදි 1 – 4 දක්වා

ගුණ – සකල ප්‍රකාර විෂ, අපස්මාර රාජයක්‍ෂමා උන්මාද භූතදෝෂ විෂයෙන් උපන් ක්‍ෂය ඉතා බේත්වලින් වූ දෝෂ ගුල්ම ප්ලීහා කාමිලාහනුස්තම්භ ආදිය නසයි.

සියලු විෂ වලට ද– විෂ වලින් වූ දෝෂයට ද මේ යොදන්නේ ය.

විෂපෙවූ ආයුධ වලින් කැපුම් කෙටුම් වැදුණු විසට

i. කහ – සහිඳ ලුණු – ගිතෙල් – මීපැණි – ශුද්ධ කළු සිවන්ගුරු – පොවනු – ආලේප කරනු.

ii. ගෝනකොළ තම්බා වතුර දෙන්න. එයම තලා තබා බඳින්න,

iii. පසුව මහ තුවාල තෙල යොදන්න.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

සියළු ස්ථාවර විෂයනට සාධාරණ චිකිත්සා

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

1. කුර මුල් කොටා පිරිකා එළකිරෙන් මිරිකා දෙන්නේ ය. දහ අට කදුරේ විෂ දුරු වේ. සියලු විෂ නිර්විෂ භාවයට යෙයි.

2. කුර තම්පලා නවසි පොල් දමා කොටා පිරිකා දෙහි ඇඹුල් මුසුව දෙන්නේ ය. කදුරු, හොඩල, ආදී සියලු විෂ සමනය වේ.

3. ඔලිඳ පත් කොටා එළකිරෙන් පිරිකා දෙන්නේ ය. කදුරු, අත්තන, හොඩල ආදී සියලු විෂ දුරු වේ.

4. පුසුල් මද යුස, තනකිරි, දෙළුම් යුස යන මේ පානයෙන්, කදුරු, අත්තන විෂ හතු වගී ඔලිඳ ඇට නියගලා ආදී සියලු ස්ථාවර විෂ නසා.

5. සඳුන් ගලගා එළකිරෙන් දෙන්නේ ය. නවසි ලොඳ සහ දිය දෙන්නේ ය. ජයපාල විෂ නසයි.

6. දමින්න පට්ටා යුස කොටා එළකිරෙන් මිරිකා දෙන්නේ ය. ජයපාල විෂ නසා.

7. මුං ඇට කැඳ අත්තන කෑ විෂට දෙන්නේ ය.

8. ඔලිඳ කොළ කොටා එළකිරෙන් මිරිකා අත්තන කෑ විෂට දෙන්නේ ය.

9. බැදී මුං ඇට, රතුලූනු, සුදු හඳුන් එළකිරෙන් අඹරා පැසවා ගෙන, අත්තන කෑ විෂට දෙන්නේ ය.

10. ඉරමුසු සහමුලින් ගෙන කොටා පොල් කිරෙන් මිරිකා දෙන්නේ ය. හොඩල කාපු විෂ නසා.

11. හඳුන්, වැල් මී, කොට්ටන් (තෙඹු අල), දෙදුරු, දෙළුම් මල්, එළකිරෙන් අඹරා හොඩල කාපු විෂට දෙන්නේ ය.

12. කප්පරවල්ලිය යුස, පුසුල් මද යුස, උක්පැණි, තනකිරි සමභාග ගෙන හොඩල කෑ විෂට දෙන්නේ ය.

13. දෙදුරු, සාදික්කා, සැවැන්දරා, අඹරා මී පැණි-යෙන් කදුරු කෑ විෂට දෙන්නේ ය.

14. තෙඹු දඬු, රතුලූනු, උක්දඬු, ඉරිවේරිය, කොටලා මිරිකා ගිතෙල් දමා කදුරු කාපු විෂට දෙන්නේ ය.

15. හෙළඹ දඬු, කොල්ලන් පත්, ඔලිඳ පත්, හීන් නැඹිලි පත්, හා පොතු කොටා යුස මිරිකා ගිතෙලින් දෙන්නේ ය. නියගලා කෑ විෂ නසා.

16. සාදික්කා, වසාවාසි, උළුවා, රතුලූනු එළකිරි-යෙන් අඹරා පැසවා දෙන්නේ ය. නියගලා කෑ විස නසා.

17. රසකිඳ, කුර මුල්, නැඹිලි මල්, කොටා එළ කිරෙන් මිරිකා නියගලා කෑ විසට දෙන්නේ ය.

18. එළකිරි, තනකිරි, උක්පැණි, සීනි, ගිතෙල් සම කර මදක් සකාරා නියගලා කෑ විෂට දෙන්නේ ය.

19. ලුණුවිල දඬු කොටා එළකිරෙන් මිරිකා බොන්-නට දෙන්නේ ය. එරඬු කාපු විෂ නසා.

20. වැටකෙයා බොඩ යුස සීනි ගිතෙල් බහා එරඬු ඇට කාපු විෂට දෙන්නේ ය.

21. ඉඟුරු යුස, දෙසි ඇඹුල්, තනකිරි සමග, එරඬු කාපු විෂට දෙන්නේ ය.

23. කෙසෙල් අල, ඉඳි බොඩ, මෙවායේ යුසට සුදු හඳුන් ගල ගා දෙන්නේ ය. ඉඳුරු කාපු විෂ නසා.

23. දෙළුම් කොළ පොතු, ඔලිඳ කොළ කොටා එළකිරෙන් මිරිකා කෝමාරිකා ස්වරසක් එකතු කර, ඉඳුරු කෑ විෂට දෙන්නේ ය.

24. වැල් පෙනෙල, කීකිරිඳිය, පුසුල් මඳ මේවායේ යුස ගෙන ගිතෙල් බහා පැසවා ඉඳුරු කෑ විෂට දෙන්නේ ය.

25. එළකිරෙන් සුදු හඳුන් ගල ගා ගෙන, එළකිරි පතකට එකතු කර, දෙළුම් යුස සමග දෙන්නේ ය. විෂ හතු වගී කෑමෙන් වූ විෂ නසා.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

26. දෙදුරු, ඉඟුරු අඹරා, වැටකේ මුල් යුස, දෙහි ඇඹුල් සමග මිශ්‍ර කර බිමමල් කෑ විෂට දෙන්න.

27. කුප්පමේනිය, ඉඟුරු, දේවදර, දෙසඳුන්, ඇටගෙන, ඇල් දියෙන් අඹරා, ගිතෙල් බහා පැසවා දෙන්නේ ය. විෂ හතු වර්ග කෑමෙන් වූ විෂ නසා.

28. දෙදුරු, අසමෝදගම්, ඉඟුරු සාදික්කා, එළ කිරෙන් අඹරා දෙන්නේ ය. බිමමල් කෑ විෂ දුරු වෙයි.

29. කුර තම්පලා කොටා එළකිරෙන් පිරිකා බිමමල් කෑ විසට දෙන්නේ ය.

30, කුර සහමුලින් පොල් දළු කොටා මිරිකා හතු කෑමේන් වූ විෂට දෙන්නේ ය.

31. වසාවාසි, සාදික්කා, රතුලූනු, සුදු හඳුන්, තන කිරෙන් අඹරා වච්චනාවි කෑ විෂට දෙන්නේ ය.

32. දේවදර, තිප්පිලි, නවසි දියෙන් අඹරා පැසවා වච්චනාවි විෂට දෙන්නේ ය.

33. වැල් දෙහි මුල්, වැල් පෙනෙල මුල්, සාරණ, වෙනිවැල් ගැට, කීකිරිඳිය මුල්, එළබටු මුල්, වරාමුල්, බෙලි මුල්, බැබිල මුල් සම භාග සියල්ල බරට පුසුල් දඬු, පුසුල් දියෙන් කකාරා සුමානයක් දවස දෙවේලේ දෙන්නේ ය. මෙය අමු රසදිය ශරීර ගත වූ අයට බොන්නට දීමෙන් රසදිය මුත්‍ර සමග පිට වේ,

34. මා එරමිනියා පොතු, දේවදර, සඳුන්, පුසුල් මද මේවා එළකිරෙන් අඹරා ඊට දිය කර අමු රසදිය ශරීර ගත වූ අයට පොවා, අච්චේ හබරල පත පිට සිටින කල දහඩිය සමග රසදිය පිට වෙයි.

35. කිරි අඟුණ කොටා කුරුම්බා වතුරෙන් උණු කර බීමෙන් කනේරු කෑ විෂ සමනය වේ.

36. කාමරන්ගා යුසට ගිතෙල් මී පැණි බහා දීමෙන් කරින්ගල (නයි හබරල) කෑ විස නසයි.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

කල් ගිය විෂ

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

විෂ කැවී කල් ගිය කල, කැසි, ක්ෂය ලක්ෂණ, පපුවේ දැවිලි, ලේ වමන, ල වූණ ගති, ඇස් කහ ගැහීම ආදී ලකුණු පහළ වෙයි. ක්ෂය රෝගය යි අන්තිමේ දී කිය හැකි රෝගයකට හැරෙයි,

ශරීර ශක්තිය ඇත් නම් මුලදී විලඳවැන්න හා කිරි වලින් ළය විරේක කට යුතුය. ශක්තිය නැත් නම් විෂ සමනය වන බෙත් දී ශරීර ශක්තිය ඇති වූ විට වමනය කර වන්නේ ය.

විෂ ගතිය අඩු වූ විට මුලටම ගෝන කොළ කසාය උදේ සවස සුමානයක් දෙකක් දෙන්නේ ය;

කාමරංගා, සියඹලා ඇඹුල්, අන්නාසි ඇඹුල්, අට එකට කකාරා ගිතෙල් සමග පානය කරන්නේ ය. ශරීරයේ තන්හි තන්හි තිබෙන විෂ එකතු වේ. ඉන් පසු ළය විරේකයක් යොදනු.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ප්‍රසිද්ධ ළය විරේක

1. තොලබෝ අල, බිම් නුග මුල්, කොටා වතුරෙන් මිරිකා තල තෙල් සමග පානයට දෙන්නේ ය. වමනය වේ.

2. විලඳ වැන්න අහුරක් ගෙන කොටා එළකිරි මනාවෙකින් මිරිකා පෙරා බොන්නට දෙන්නේ ය. වමනේ වෙයි.

3. තිත්ත වැටකොළු පලස්වරස පතකට තලතෙල් මේස හැන්දක් දමා දෙන්නේ ය. වමනය වේ.

වමනේ වැඩි වෙයි නම් සූකිරි දෙහි ඇඹුල් සමග දෙන්න. සාදික්කා දෙහි ඇඹුලෙන් දිවේ ගාන්න. කස පැන් දියට සුදු හඳුන් ගලගා දෙන්නේ ය. දෙළුම් යුස, මී පැණි සූකිරි සමග දෙන්න, වමනේ නවතී.

යෑහෙන තරමක් වමනය වූ විට කිතුල් හකුරු හෝ පොල් හකුරු කෑල්ලක් කන්නට දෙන්නේ ය. වමනය නවතී. ගමනක් දෙකක් පාවනය වෙයි.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

ළය විරේක කිරීමට කලින් මල් බුලත් පුටුවක් සාදා ළය විරේක බෙහෙත සූදානම් කර "ඕං ශ්‍රී පොඃ – මන්ත්‍රය සත් විටක් කියා ඒ බෙහෙත ආසනයෙහි තබන්න.

"ඕං පාදූ පාති පානා පාති ඒස්වඃ" මේ මන්ත්‍රය සත් වරක් ජප කර පානා අවුල වනු.

"හඳුන් ගලගා" එහි තබා – ඕං සිද්ධ බුද්ධ ආඥා වෙන් සිද්ධ බුද්ධ ඒස්වා හඃ' මෙයින් ඒ මතුරනු. ඒ වුවමනා වුනි නම් පපුවේ ගෑමටයි.

බෙහෙතට "ඕං කලන්දර උඩ යාරුං නාන් පත් සන්නිත් පත් ඕඩු" මෙයින් 108 වරක් වතුර – දෙන්න.

වමනය හිටවන්නට වුවමනා වූ විට ඕං ආඩු නෙ මූනි මුනි ඒස්වා හඃ– මෙය අතට මතුරා පිටට අත ගසනු.

ඕං නීල නීල නීල සුම්බුනි කේසා පානි සිරඃ– දෙහි කපනු.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

වමනය කරවා, නිර්විෂ භාවයට පමුණුවන, කසායක් දෙකක් දී විරේක කරවන්නේ ය,

1. අරලු කලං 2, පෙති පුවක් වියලිවා කලං 2 යි, සහිඳ ලුණු කලං 2 යි, කෝමාරිකා මඳ කලං 3 යි, සියඹලා නැටි හා කොළ කලං 3 යි, සීනි කලං 1 යි, අට එකට සිඳ දෙවරකට දෙන්නේ ය. වස කුඩු විරේක වෙයි.

2. අරලු කලං 5 යි, සහිඳ ලුණු කලං 1 යි, කොල්ලු කලං 2 යි, බුළු කලං 1 යි, ඉඟුරු කලං 3 යි, වැල් මි කලං 6 යි, අගිල් කලං 2 යි, තිරස්සවාළු කලං 6 යි, දේවදාර, සුදු දුරු, කළු දුරු, අසමෝදගම්, වළහසාල්, උලුහාල්, ගම්මිරිස්, කුරුඳු පොතු, කොල්ලන් පත්, පුසුල් ඇට, දෙළුම් ඇට, හිරස්ස පලු කලඳ බැගින්, වියලා සුණු කර ගන්නේ ය.

සියඹලා පත් යුස, එළ ගව මූත්‍ර, තැඹිලි දිය, එළ කිරි, නැළි 2 බැගින්, ගිතෙල් මනාවයි, සීනි පලමයි.

පදමට කකාරවා, සිඳ ගෙන, වරකට බුළු ගෙඩියක් පමණ වළඳන්නේ ය. දවසට දෙවර බැගින් අට දිනයි. සියලු වස බඩ නොරඳා ඉගිලී යෙයි. වස ගිනියම දුරුවී යේ. සියලු විෂ නසා,

ළය විරේක, විරේක, දෙකින් විෂ අහක් කර ශේෂවූ යම් විෂක් තිබේ නම් එය නිර්විෂ භාවයට පැමිණ වීමට මෙහි පහත දක්වෙන කසාය දෙන්නේ ය. මේ කසායෙන් කොයි විෂත් සමනය වේ.

1. පුසුල් දඬු, නෙළුම් දඬු, ඉරිවේරිය, අගිල්, සුදු හඳුන්, සැවැන්දන, දෙළුම් ඇට, රතුලූනු, මහුල් කරඳ මුල්, කුර මුල්, පලම් 2 ක් ගෙන, එළකිරි පතයි, දිය පත 7 යි, පතට සිඳ දෙවරකට දෙන්නේ ය.

2. හාතාවාරිය අල, සුදු හඳුන්, බැබිල මුල්, සිරිවැඩි බැබිල මුල්, එළ ඔලිඳ මුල්, කිරෙන් හෝ තැඹිලි දියෙන් හෝ නවසි වතුරෙන් හෝ සිඳ දෙන්න. විස සමනය වේ.

3. පුසුල් බස්නය පුසුලක් ඇස්ස කපා මද හැර, ඒ යුස පිරිකා ගෙන, ඊට එළ ඔලිඳ පත් යුස, ඉදිබඩ යුස, එළකිරි පත බැගින් එකතු කර පුහුලට යොද, ත්‍රිවර්ග, වැල්මී, බැදි පුස්කර, බැදි සීනක්කාරන්, සහිඳ ලුණු කලඳ බැගින් අඹරා පුහුලට දිය කර, දිය සැළියක තබා– උදය සවස පත ½ ය බැගින් බොන්නේ ය.

දූෂි විෂ, රත්පිත්, කරකැවිලි, රක්ත පිඩනයේ අධිකත්වය, ඇඟ ඉස කරකැවීම උස්මුරුත අතපය රුදු ප්‍රමේහ දෙෂ මූත්‍ර බද්ධ උමතුතා රත්පිත් සමනය වේ.

4. බෙලි මද, දිවුල් මද, මානෙල් අල, රතුලූනු, පළොල් මුල්, කුර මුල්, කෝමාරිකා මද, රත්මානිස්ස මුල් සමව ගෙන, නවසි වතුරෙන් කකාරා දෙන්නේ ය. සෑම විෂ සමනය වේ.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

වසන්ත මාලනී ඝෘතය

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

වැල්මී, පොඩි දූල් (හෝ තුවරලා), තෙඹු අල, දේවදර, වාල් මොලඟු, කීන අරටු, ඒලවාලූක (හෝ කළුවා අල) නාමල් රේණු, මානෙල් අල, වලහාසාල්, සුදු හඳුන්, කොල්ලන්පත්, ප්‍රියංගු (රුක් මල්) වෙට්ටිවේර් (ගඳපාන කණ), කහ, ගැට කහ (වෙනිවැල් ගැට) දෙ බටු, ඉරමුසු මුල්, කිරිවැල් මුල්, කබරසදලු, හීන් උඳුපියලි, මහ උඳු පියලි, අස්වැන්න, පලම් 1 බැගින් ගෙන, මාරා පයඟ පලම් 20 යි, දිය නැළි 32 ක් බහා අටට සිඳ පෙරා ගෙන, ඉහත කී ද්‍රව්‍ය කලං 2 බැගින් ගෙන කල්ක කර ගිතෙල් නැළියක් බහා, පදමට කකාරා පෙරා ගන්නේ ය.

ධරණ 1 - 8 දක්වා, සියලු ස්ථාවර විෂ වලට යොදන්-නේය. සියලුම විෂ සමනය වෙයි.

සර්ව දේව රාම රසායනය

ඇට ඇර මිරිකා මදක් අවුවේ ද තෙත සිඳුවා ගත් පුසුල් මද පලම් 100 යි, ගිතෙල් නැළියයි, මෙය තම්බා ගෙන, පුසුල් දියෙන් සූකිරි පලම් 100 ක් දිය කරගෙන, ඊට පුසුල් එල යොද පාක කරන්නේ ය. පාක කරන කල්හි තිප්පිලි ඉඟුරු පලම් 2 බැගින් ද - වළඟසාල්, කුරුඳු පොතු, කොල්ලන් කොළ, කොත්තමල්ලි, සුදු හඳුන්, රත් හඳුන්, වැල්මී, එළ ඔලිඳ මුල්, ඉඟිනි ඇට කලං 3 බැගින් ද - කරාබු නැටි, එසවාසි, සාදික්කා, එන්සාල්, වළඟසාල් වාල්මොලගු කලඳ බැගින් ද අඹරා යොද, පදමට කකාරා ගන්නේ ය. නිවුණු පසු මීපැණි මනා-වෙකින් අනන්නේ ය.

කලං 1½ යි, කාස. ශ්වාස, හික්කා, අරුචි, රත්පිත්, ක්ෂය, රාජයක්ෂමා, දූෂී, විෂ නසා, මෙය විෂ නිසා, කාසයද ක්ෂයද සෑදීගෙන එන විට දෙන්නේ ය.

පිත් තෛලය

රසකිඳ, ඉරමුසු, ඉරිවේරිය, මුඟුණුවැන්න, කීකිරිඳිය, වැටකේ, අරලු, කෝමාරිකා මේවායේ යුස නැළිය බැගින්,

රාවණ පුස්තක සංරක්ෂණාගාරය

එළකිරි නැළි 4 යි, තල, එරඬු. ගිතෙල් මනාව බැගින්, කල්කයට - වැල් මී, දෙසඳුන්, ඉඟිනි ඇට, නාමල් රේණු කලං 6 බැගින්, අඹරා යොද මෘදු පාකයට තෙල සිඳ ගන්නේ ය.

ඉස අල්ලන්නේ ය. ඇඟ ගල්ලන්නේ ය. පානයට දෙන්නේ ය. උක්පැණි, මී පැණි, තැඹිලි දිය ආදී පථ්‍යයි.

විෂ නිසා වූ දැවිලි, ඇස් ඇදිරි, පිත් විකාර, මුත්‍ර දහ, යෝනි දහ, මල මාර්ග දහ, ඇස් දැවිලි ආදිය නසා, උමතුවට ද - ප්‍රදර රෝගයනට ද - අධික රක්ත පීඩනය වද මේ තෙල හිසට දමන්නේ ය.

බ්‍රහ්ම පිත්ත තෛලය

බැබිල, එළ ඔලිඳ පත්, කෝමාරිකා, වැටකේ මුල් හා බොඩ, කිතුල් මුල් හා බොඩ, කෙකටිය, ඉරමුසු, අලු කෙහෙල් අල, පුසුල් එල මේවායේ යුෂ නැලිය බැගින් එළකිරි, තැඹිලි දිය, නවසි වතුර, උක් පැණි, කිතුල් පැණි, නැලි 2 බැගින්, තලතෙල්, එරඬු තෙල්, මී තෙල් ගිතෙල් නැලිය බැගින්,

කල්කයට - වැල් මී, සුදු හඳුන්, කලං 6 බැගින්, එන්සාල්, උරුලෑ සවටන්, දේවදර, සතකුප්ප, ඉඟිනි ඇට, කරුවා අරිසි, අගිල්, ගුගුල්, සහිදලුණු, රතුලූනු, කිතුල් හකුරු, මානෙල් අල, කෙකටිය අල, සස්සඳ මුල්, තෙඹු අල, හොරවල කලං 2 බැගින්, අඹරා යොද පදමට තෙල සිඳ පෙරා ගන්නේ ය.

අභ්‍යංග - පාන - නස්‍ය - කරනු. විෂ නිසා වූ ද - ස්වාභාවික දෝෂයන් නිසා වූ ද, දැවිලි, පිත් විකාර, මූර්ඡා ක්ලාන්ත, භ්‍රම; රත්පිත් ආදිය සමනය වේ.

රක්ත ප්‍රදර-ශ්වේත ප්‍රදර-මුත්‍ර මාර්ග දහ-යෝනි මාර්ග දහ-මල මාර්ග දහ-හිස දහ-ඇස් දහ-පපුවේ දැවිලි ආදියෙ දී හිසට දමනු. පානය කරනු - ඒ ඒ තැන්වල ගාණු.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

උමතු – අධික රක්ත පීඩන ආදියේ දී ද හිසේ ගානු. නස්‍ය කරනු – පානය කරනු.

පරණ විෂ – මූෂි විෂ – ඉනා විෂ – ආදියට මෙය පිරිත් කියා භාවිතයෙහි යොදන්න.

විෂහරණය

සුදු හඳුන්, වැල් මී, දේවදර, කළුදුර, සුදුදුර, අසමෝදගන්, රතුලූනු, උළුහාල්, වියලි ඉඟුරු, සහිඳලූණු, මලිත්ත මල්, රණවරා මල්, සමන් පිච්ච මල්, නෙළුම් මල් රේණු, නාමල් රේණු, දෙළුම් මල්, සපු මල්, මානෙල් මල්, කලං 2 ක බැගින් අඹරා, තැඹිලි ගෙඩි 2 ක වතුර, ටික ටික, අස්කර දමා, වැලිමහප්පල්ලේ තබා, ගිනි කර කකාරවා පෙරා, පත බැගින්, සීනි, ගිතෙල්, තනකිරි බිහා බොන්නේ ය. සියලු විෂ ද යෙ යි.

මහා ජීවානන්ද තෛලය

සැවැන්දන, ඉරිවේරිය, කලාදුරු අල, ඉරමුසු, කුප්පමේනිය, කරල් හැබ, මදුරු තලා, දදකීරිය, බෙලි, හාතාවාරිය, රන්මානිස්ස, වේලා, කටුකරඬු, කුරුදු වැල් බැබිල, ගස් බැබිල, සිරි වැඩි බැබිල, ආඩාතෝඩා, රසකිඳ, කිඩාරන්, කෙසෙල්, ගොඩ මානෙල්, කීකිරිදිය, මුගුනුවැන්න, විලදවැන්න, පුස්වැන්න (පොල්පලා) මකුළුවැන්න (ගොටුකොළ හෝ) ලේ වැන්න, මානුග, සස්සද, කිරි අඟුණ, ඇත්අඟුණ, මැඩහගු (වෙලි පරිත්තිය) යක්නාරන්, කුඩුමිරිස්, දූල්වැල්, ලූණුවරණ කරද, මුරුංගා, වෙල්ලන් ගිරිය, බටු, අවරිය, කැප්පටියා අන්කෙන්ද, අහු, අත්තන, කොවක්කා, තුඹකරවිළ, උඳුපියලි, අඩනහිරිය, යක්බේරිය, පඹුරු, වැටකේ, කොසඹ, නික, රතඹලා, එළනිවුල්, එළඹලිඳ, වැල්කසඹිලියා, පතොක්, ගොන්කැකිරි, නියද, තොටිල, ගම්මිරිස්. වදකහ, අමුඉඟුරු, විෂ්ණු ක්‍රාන්තිය. දෙහි, දෙඩම්, සූර්යකාන්ත, නාරන්, වරා, සන්නිනායන්, අමුක්කරා, එරඬු, ඉද්ද, කරඹ, දලුක්, කාමරංගා, ගැටතෝඩු, එරබදු, හිඟුරු පියලි,

කුකුරුමුවන්, එළබිත්තඹුරු, පිල, කටුපිල, අරත්ත අල ඵහ අරත්ත, කළුවා, කැලනිය, වල් ඉඟුරු, ජ්කාවේරිය, දියමානෙල්, නෙළුම්, පුපුල. සස්සඳ, දියමෙණේරිය, කිඹුල්වැන්න, පුසුල් දඬු, කුර, සැවැන්දන, ඉලුක්, ඊතණ, කළුදක් පලම් 2 බැගින් ගෙන, තැඹිලි දිය, නවසිදිය, ටෝරු දිය, කිතුල්තෙලි දිය, උක්දඬු යුස, මාරාපසහ යුස, උළකිරි, හාතාවාරිය අලයුස, නැලි 16 බැගින් ගෙන, පාදයට සිඳුවා පෙරා ගෙන

පුසුල් යුස, හෙළනෙළුම් දඬු යුස, මානෙල් දඬු යුස, ඕලු දඬු යුස, අලුකෙසෙල් අල යුස, හපුපොතු යුස, රැක් අන්නනපොතු යුස, ගෝමුත්‍ර, නරමුත්‍ර, නැලි 4 බැගින්, තෙල්පස නැලි 2 බැගින්, කල්කයට - දෙදුරු, අසමෝදගම් ත්‍රිජාත, තිප්පිලි, රිදී තුත්තත්, පෙරුම්කායම්, ගලිස්, පල්මාණික්කම්, සීනක්කාරන්, වැල්මී, කොට්ටන් (තෙබුඅල) කොත්තමල්ලි, වළඟසාල්, උලුහාල්, ශතපුෂ්ප, දේවදර, වාල්මොලඟු, උලා අරිසි, රත්හිරියල් භස්ම, මනෝසිල, ලඬහිරියල්, කටුකරෝසන, කොරාසානි, වෙප්පල්අරිසි, ක්‍රිමිශත්‍ර, සිරිතේක්කු, සුදුපාසානම්, ගෞරිප්පාසානම්, නිල ගරුඩපාසානම්, පුස්කර, සාදිලිංගම්, ඕංකාරම්, සහිඳ ලුණු, රසදිය, නෙල්ලික්කා, ගෙන්දගම්, ඉඟුරු, ගම්මිරිස්, අබ, වදකහ, කුඹුරු ඇටමද, දූත්තමුල්, සිවන්ද, පාසානම්, කහවේනමාලු (හෝ අං) වච්චිනාවි, තිපල්, මොනරපිල්, ඉත්තෑකුරු, සුවසලුණු, බළල්ලුණු, අක්‍රපට්ටා, මාසක්කා, ඉඟිනිඇට, සුවඳ සඳුන්, තිරස්සවාලු, එන්සාල්, බිංදුම්මල, දිවුල්ලාටු, සුදුලූනු, ගෝරෝචන කලං 2 බැගින් අඹරා මද ගිනි කර, පිරිත්පුරවමින් තෙල සිඳ මෘදු පාකයට බාගන්නේය.

සියලු කර්මයෙහි ම යොදන්නේය.

පානමාත්‍රාව බිංදු 30 සිට ග්‍රෑම 2 දක්වා, සියලු ආකාර ස්ථාවර, ජංගම විෂයෙන් වූ සකල උපද්‍රව, වාතරෝග, සෙම්රෝග, පිත්රෝග, ඇඟපත වෙවුලුම්, තිමිරවායු, දසවක කුෂ්ඨ, ඇඟපත ගිනියම, මෙහසන්නි, මාන්දම්, වලිප්පු, කෝල, ඉසේ සියලු ලෙඩ, සියලු ගෙඩි, බිබිලි, විසප්පු,

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සත පිටපතකි

දහඅටගුල්ම, වලිප්පු 4448 ක්, ඔල්මාද, පිස්සු විකාර, සියලු පිත් විකාර, අධික රක්ත පීඩන, රක්තාශය පිළිබඳ රෝග, දහ, මූත්‍රමාර්ගදහ, යෝනිමාර්ගදහ, මලමාර්ගදහ, පපුව ඇතුළ දැවිම, ඇස් දැවිම, ඉස දැවිම ආදිය නසා සියලු විෂට යුතුසේ යොදන්න. කිළිකුණුවලට අනු නොකරන්න. තුන් පිරිතෙන් දහක් පුරවන්න, ඛන්ධපරිත්තයෙන් 1000 ක්ද පුරවන්න.

කදලි ක්ෂාර

අලුකෙහෙල්ගෙඩි - එම අල - එම පත් - එම මුහ - එම කද පිලිස්සූ අලු පලම බැගින්, මුහුදු ලුණු බැද කලං 1යි, සුදුදුරු, ගම්මිරිස්, අසමෝදගම්, තිප්පිලි, තිප්පිලි මුල්, සිවිය මුල් කලං ½ ය බැගින්, සියල්ල චූර්ණකර වරකට කලං 1 – 1½ දක්වා, දීකිරි සමග කෑමෙන් විෂ සමනය වේ. උදර – අර්ශස්, දූවිලි, වාතරුජා, දිය වැඩියා, දුරුවේ.

ප්‍රතිවිෂ

1. මොනරමස්, වටුමස්, එරබුදුරින් පිස, එමතෙල් මුසුව අනුභව කළාහට විෂවෙයි.

2. ගෝමස්, ගිනිපෙදිමස් පෙරකී ලෙස පිස කෑ අයට ද විෂවෙයි.

3. මී පැණි, ගිතෙල් සමව කෑමෙන් විෂ වේ.

4. මී පැණි සුණුපැන් සමග හෝ වැසිදිය සමග අනුභව කළාහට විෂ වේ.

5. මී පැණිත්, ඌරුමසුත් කෑ හට ද – රාබුත් ඌරු– මසුත් කෑ අයට ද විෂවෙයි.

6. කොකුන්ගේ මස් කා රාබීහට ද කුකුළුමස් කා දීකිරි වැළඳුවා හටද විෂ වේ.

7. උක්සකුරු, කෙසෙල් හා මී මෝරුද මීකන්පලා සහ කුඩමස්සන්ද එක දවසේ අනුභව කළාහට විෂවේ.

8. කැකිරි සමග තියඹරා ද – බටු, පුසුල්, අබද – තලමුරුවට, ලුණු සහ දී කිරිද – දියමුස් හා ඌරුමස් ද – කිරි සමග කුඩමස්සන්ද – කිරි සමග ඌරුමස්ද – අනුභව කළාහට විෂ වේ.

9. පුදගු මල් අඹරා ඇඟ ගාගෙන කිරිබත් කෑමද – කොබෝලස් සැමිද අබතෙලින් බැද කෑම ද විෂවේ.

10. පිළුණු වූ අමුලස් වැළඳීමද – මසුන් දීකිරි සමග වැළඳීමද – ගිතෙල් සමග මෝරුද – තල කිරිබත් සමග රාද – එකවිට කන්නාහට විෂ වේ.

11. පිසුන්ගේ බීජකෝෂ හා මසුන් අනුභව කිරීම විෂවේ.

12. ලෝ වළදේ තිබූ ගිතෙල් අනුභවය විෂ වේ.

13. වෙඬරු හා කෙසෙල් ගෙඩි විෂ වේ.

14. ලුණු සහ පැණි රස විරුද්ධ වේ.

15. ලුණු සහ තිත්තරස විරුද්ධ වේ.

මෙසේ වූ විරුද්ධ ආහාර අනුභව කළ ආතුරයා හට පළමුකොට වමන විරේක කරවා, ඉක්බිති සෑදී තිබෙන ලක්ෂණ වලට අනුව–විෂ සමනය වන ප්‍රතිකාර කරන්නේය. උම්මාද – වමන – දවිලි – දවිලි– ඇති වූ කල පිත් සමනයට චිකිත්සා කරන්නේය.

i. රතුලූනු, කුරමුල්, දෙළුම් ඇට, සුදු හඳුන් කසාය කර, එළකිරි දමා දෙන්න. සියලු විෂ නසා.

ii. බෙලිමද, දිවුල්මද, රතුලූනු, මානෙල් අල, කුරමුල්, පුසුල්දඬු කසායකර දෙන්නේය, නොයෙක් විෂ සමනය වේ.

iii. කුරමුල්, රතුලූනු, කිකිරිදිය, වැටකයා බොඩ, කොටා නවසිවතුරෙන් මිරිකා බොන්නට දෙන්නේය. සියලු විෂ නසා

ඒ ඒ විෂ, නිර්විෂ භාවයට පමුණුවන ඔසු

1. සක්පලු, හුණු ආදිය කෑවිම –කහඅල යුස, කිකිරිදිය යුස, තලතෙල් පෙවා වෙන වෙනම දෙන්නේය.

2. ගිතෙල් මීපැණි සමව කෑ විට – සියඹලා ඇඹුල්ද – පුරාණ පිළිස්සූ අඟුරු ගොරා දියට මිශ්‍රකර පොවන්නේය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

3. කපුරු කෑ විෂට – කෙහෙල් මුහ යුය හා තනකිරි, මාදම්පොතු යුය, ජම්බු එ යුය පොවන්නේය.

4. වරාකෑවිෂට – තලතෙල් හෝ කොසඹතෙල් හෝ ඉරිවේරිය යුය හෝ, පුස්කර කුඩු දියකළ කුරුම්බාවතුර හෝ නෙල්ලි කසාය හෝ වෙන වෙනම දෙන්නේය.

5. වරාමුල් විෂට – එළකිරි හා හීන්ගෙඳ යුය, කිරි හා කහ යුය පොවන්නේය.

6. බඳුල්ල විෂට (එම කිරි විෂට) පොල් කිරි, පොල් තෙල් දෙන්න.

7. බඳුල්ල කිරි ගෑවී ඉදිමුණ තැන – බුලත් දලු අඹරා මදක් රත්කර ගාන්නේය.

8. තිත්ත වැටකොලු විෂට – පොල් කිරි; පොල්තෙල් කලාඳුරුඅල කසාය, එළකිරි; මීඅරටු කසාය, කිහිරි කසාය, වෙන වෙනම දෙන්නේය.

9. අත්තන විෂට – එළකිරි, නෙළුම් දඬු යුය, පලු දඬු යුය, උක්සකුරු සහ එළකිරි, ගිතෙල් 2 භාගයක් උක්හකුරු 1 භාගයක් සමග; අඟුණ මුල් කිති කසාය, ගිතෙල් සමග; අරලු සුණු එරඩු තෙලින්, දෙන්නේය.

10. දලුක් කිරි විෂට – උඩක්ක පලාද, පොල් කිරිද, පොල් තෙල්ද දෙන්නේය.

11. මත් අමු විෂට – මාරාමල් කසාය ද, මෙනේරි කැඳද, සැවැන්දන කසාය ද, අරලු සමග ද දෙන්නේය.

12. ඒකාවේරිය විෂට – අරලු කසාය දෙන්නේය.

13. මත්ෂ්‍යයන් මුගටියන්ගෙන් වූ විෂට – උක්පැණි, මාරාපසඟ සිඳ කසාය දෙන්නේය.

14. කපුරු තැබිලි දෙක එක්වූ විෂට – අඹ ඇඹුල් දෙන්න.

15. වැල වරකා දෙකින් වූ විෂට – අඹ ඇඹුල්ද – ඉඟුරු යුයද දෙන්නේය.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

16. ලුණු කැමෙන් වූ විසට – වැටකොළු කසාය හෝ අරලු කසාය දෙන්න.

17. හරක් මසින් වූ විෂට – මුරුංගාමුල් කසාය දෙන්න.

18. මීමස් විෂට – නිකදලු, මුරුංගා මුල් යුස හෝ කසාය දෙන්න.

19. සාමස් කැමෙන් වූ විෂට - කරල් සැබ මුල් කසාය දෙන්න.

20. ඌරු මසින් වූ විකාරයට – කකුල්, දිවුල් වේරළු කරව්පොතු, ඉඟුරු උණුපැනින් අඹරා දෙනු. ඉදිබොඩ කසාය දෙන්න. ඉදිබොඩ කන්නට දෙන්න.

21. තිරෙළුමස්, මුවමස් කැමෙන් වූ විෂට – කුරුඳුපොතු බෝමුල්, ගම්මිරිස්, කසාය දෙන්න, හිඟුරු පොතු කසාය

22. තල කිරිබත් විෂට – ගිතෙල් ගල්ලන්නේය.

23. ගිරියල් විෂට - තලමුල් යුසට මකුල් දිය කරද, ඇට්ටවර කසාය ද දෙන්නේය.

24. තිත්ත ලබු විෂට – සාරණ කසාය ද

25, මෝනර මසින් වූ විෂට – මුරුංගා පත් යුසද – දිවුල් ද වෙන වෙනම දෙන්නේය.

26. කුකුළු මසින් වූ විෂට – මුරුංගා මුල් යුසින්ද

27. මීපැණියෙන් වූ විෂට – ඇල් පැන්ද, කිරි අඟුණ යුසද, මොරඑල යුස ද දෙන්නේය.

28. ගිතෙල් විෂට – ඉඟුරු, සුණු උණු පැනින්ද. මොර පිසූ කැඳද දෙනු.

29. එළකිරෙන් වූ විෂට - කිරි අඟුණ යුස හා කසාය ද

30. කිරි බතින් විෂට - ඉඟුරු යුසද,

31. සියලු කැවුම් ජාතියෙන් වූ – විෂට එළමෝරුද – හාල්දෙවුන් දිය ද, දෙන්නේය.

32. පුස්කර වලින් වූ විෂට – තැඹිලි කිරිද, තලතෙල්ද,

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි

33. නිල් කටරොළු විෂට – කලාදුරු අල කසාය ද,

34. සියලු හතු ජාති විෂට– නරමුත්‍ර, ගෝමුත්‍ර, තිප්පිලි ද වෙන වෙනම දෙන්නේය.

35. සුදුලූනු විෂට – තෙඹු අල යුසද, හාල් දෙවුන් ඉඟිනි ඇට ගලගා ඇල් දියෙන්ද,

36. අඹ කෑමෙන් වූ විෂට – කසපැන් හා දිවුල් යුස ද,

37. කුකුරු මුවන් විෂට – තෙල් සහිත වූ මෝරු දිය ද,

38. රත් නිවුල් විෂට – සීනි, උක්හකුරු ඇල් පැන් ද,

39. වැල්මී විෂට – දඹ එල ද

40. අඹ හා කිරි එක් වූ විෂට – මුං රසද, වැල්මී කසායද,

41. කපුරු කෑ විෂට – කොවක්කා යුස ද,

42. හුණු හිරියල් විෂට – එරබදු යුස ද,

43. කිරිබදු අල, එළබින්තඹුරු කොළ කෑ විෂට – පේර කොළ, කොත්තමල්ලි කසාය, පැණි සමග ද, පේරකොළ කැඳ පැණි සමගද දෙන්නේය.

44. නියඟලා විෂට – කූරමුල් යුස පොල් කිරිද, දෙහි ඇඹුල් දමා දෙන්න. ඉඟුරු, රතුලූනු, කූරමුල් යුස දෙහි ඇඹුල් තනකිරි සමග දෙන්න.

45. සියලු විෂට – රතුලූනු, කූරමුල්, දෙලුම් ඇට සුදුහඳුන්, සැවැන්දන, සිරි වැඩි, බැබිල මුල්, පුසුල් දඬු – පේරපත්, කූරමුල්, කිතුල් මුල් කසාය ද – කාල මෙස යුසද දෙන්නේය.

46. වදකහ නිසා වූ විෂට – කිරෙන් බත් දෙන්න – මුං ඇට තම්බා වතුර දෙන්න, පුසුල් යුස – පුසුල් කරටි කසාය – දෙහි ඇඹුල් සූකිරි – ගිතෙල් සහිඳ ලුණු කුඩු – හකුරු දෙඩම් යුස දෙන්නේය.

47. කරඹ කොළින් වූ විෂට – පේර කැඳ හකුරු සමග දෙන්න.

රාවණ පුස්තක සංරක්ෂණාගාරය සතු පිටපතකි